**<u>2025.10.21 දින පෙ.ව. 09.30 ට බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල රැස්වීම් ශාලාවේදී පවත්වන ලද බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2025 ඔක්තෝම්බර් මස මාසික සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.</u>**

සහභාගිත්වය :-

1. ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. ඩබ්. ඩී. ප්‍රසන්න ප්‍රදීප් කුමාර ගුණවර්ධන මැතිතුමා - ගරු උප සභාපති
3. කේ. ඩී. මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
4. පී. ලෙනිකා දුශාන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රිනී
5. ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා - ගරු මන්ත්‍රී
6. ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා - ගරු මන්ත්‍රී
7. ආඩිගේ රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා - ගරු මන්ත්‍රී
8. උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී
9. ඩී. ඩී. නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
10. එම්. ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා - ගරු මන්ත්‍රී
11. ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා - ගරු මන්ත්‍රී
12. කේ. කේ. පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
13. නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී
14. ලියනගමගේ අභයරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
15. එච්. තිලක් උපුල් චමින්ද මැතිතුමා - ගරු මන්ත්‍රී
16. යූ. කේ. මධුභාෂිකා දිල්හානි මැතිතුමිය - ගරු මන්ත්‍රිනී
17. ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා - ගරු මන්ත්‍රී
18. බී. සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා - ගරු මන්ත්‍රී
19. ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී

සහභාගී නොවූ :-

1. මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමා - ගරු මන්ත්‍රී
2. එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා - ගරු මන්ත්‍රී
3. සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා - ගරු මන්ත්‍රී
4. ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා - ගරු මන්ත්‍රී

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 9.30 ට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරුන් 18 දෙනෙකුගේ සහභාගීත්වයෙන් යුතුව සභාවේ කටයුතු ආරම්භ විය.

**<u>ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු සියලු සභිකවරු, ප්‍රාදේශීය සභා ලේකම්තුමිය, ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරීතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ද, මාධ්‍යවේදී මහත්වරුන් ද සාදරයෙන් පිළිගන්නා ලදී.

**(1). <u>පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම</u> :-**

(1)(1). 2025.09.16 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාවට අදාළ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් දැනුම් දෙන ලදී.

සංශෝධන ඉදිරිපත් නොවූ බැවින් 2025.09.16 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව, ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(2). <u>ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන විශේෂ නිවේදන</u> :-**

(2)(1). මගේ අංක GDI/DEV1/01/2026 හා 2025.09.30 දිනැතිව දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් "2026 සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම" මැයෙන් යුතුව ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. ඉදිරි වසරේ දී එම දෙපාර්තමේන්තුව වෙත හිමිවන ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කිරීම සඳහා අප ප්‍රදේශයේ කඩිනමින් ඉටුකළ යුතු වාරි යෝජනා පහක් එම ආයතනය වෙත දන්වා එවන ලෙස දැනුම් දීලා තියෙනවා. මම ගරු මන්ත්‍රීවරුන්ට දැනුම් දෙනවා ඔබ කොට්ඨාසය තුළ එවැනි කඩිනම් වාරි යෝජනා තිබෙනවා නම් සිකුරාදා දිනට පෙර එම යෝජනා ලිඛිතව කාර්යාලය වෙත ලබා දෙන්න කියලා.

(2)(2). මගේ අංක 3/1/1/බෙන්.ප්‍රා.ස. හා 2025.09.29 දිනැතිව පළාත් පාලන කොමසාරිස් විසින් "පළාත් සංවර්ධන සැලැස්ම 2025, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, පළාත් පාලන මාර්ග - නව වැඩ, සංශෝධන - 22" මැයෙන් යුතුව ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. මේ වන විට ආරම්භ කරලා තියෙන ව්‍යාපෘතියක නම වෙනස් කිරීමක් ගැන මේ කියන්නේ. කලින් අනුමත වෙලා තියෙන වැඩ යෝජනාව තමයි "බෙන්තොට හොරවල තොටුපල හන්දියේ සිට තොටුපල පාර ඉත්තෑපාන දක්වා ඇති මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම" සංශෝධිත වැඩ යෝජනාව "බෙන්තොට හොරවල තොටුපල හන්දියේ සිට ඉත්තෑපාන තොටුපල දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම"

**(3). <u>ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.</u>**

(3)(1). මගේ අංක බෙන්/6/11/4-2025 හා 2025.09.30 දිනැතිව "ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2025, අනුමත ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා එකඟතාවය ලබා ගැනීම" මැයන් යුතුව බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. සභාව සතු මාර්ග 10 ක් සංවර්ධනය කිරීමට මේ වන විට ප්‍රතිපාදන ලැබී ඇති බැවින් ඒ සඳහා එකඟතාවය ලබා දෙන මෙන් දන්වා තිබෙනවා.

**(4). <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.</u> :-** කිසිවක් නැත.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 9.45 ට ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය, ගරු මන්ත්‍රී නිස්සංක දේශප්‍රිය මැතිතුමා හා ගරු මන්ත්‍රී රුසිත නන්දන තුෂාර මැතිතුමා ගරු සභාවට පැමිණෙන ලදී.

**(5). <u>යථා පරිදි කල් දී ඇති යෝජනා</u> :-**

**(5)(1).** **<u>ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>**

(5)(1)(1). බෙන්තොට අංගාගොඩ පෙර පාසල් ඉඩම වටා ආරක්ෂිත දැලක් ඉදි කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.
එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූශාන්ති මැතිතුමිය</u>**
මේ ගොඩනැගිල්ලට බල්ලෝ ඇතුළු වෙනවා. ඒ සත්තුන්ගෙන් බලු මැක්කෝ පවා හැලෙනවා. ඒ වගේම මේ වර්ෂා කාලයේ දී මුළු පෙර පාසල් වහළයම තෙමෙනවා. මේ වගේ අපහසුතා රාශියක් මැද්දේ පෙර පාසලට ලබන වසරේ සිසුන් තවත් අඩු වේවි. ඒ නිසා ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**
මේ භූමිය හරහා පිටස්තර පුද්ගලයින් ගමන් කරනවා. බල්ලෝ, පූසෝ, හරක් වැනි සතුන් ඇතුළු වෙන නිසා ගොඩක් දවස්වලට දෙමාපියන්ට පෙර පාසල හෝදන්න සිදු වෙනවා. මේ භූමිය සම්පූර්ණයෙන් අපිට අයිති වූවක් නොවෙයි. මේ නිසා සභාවට අයිති කොටස පමණක් දැල් මඟින් ආවරණය කිරීම සුදුසුයි.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(5)(2).** **<u>ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.</u>**

(5)(2)(1). නෙළුම්පොකුණ ගමට පිවිසෙන ප්‍රධාන පාර (ග්‍රාම නිලධාරී කාර්යාලය පසුකර) මීටර් 400 ක් පමණ කොන්ක්‍රීට් කර සැකසීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>**
මේ මාර්ගය සකස් කිරීමේ කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සිදුවෙමින් පවතිනවා.

**<u>ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය</u>**
එසේ නම් එම යෝජනාව න්‍යාය පත්‍රයෙන් ඉවත් කරන මෙන් මම ඉල්ලා සිටිනවා.

(5)(2)(2). නෙළුම්පොකුණගම ත්‍රිවිල් අජන්ත මහතාගේ නිවස ළඟ සිට නිරෝශා මහත්මියගේ නිවස දක්වා මීටර් 400 ක් පමණ පාර කොන්ක්‍රීට් ඇතිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>**
මේ මාර්ගයේ අලුත්වැඩියා කටයුතුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සිදු වෙනවා.

**<u>ගරු මන්ත්‍රිනී, මධුභාෂිකා දිල්හානි මැතිතුමිය</u>**
එසේ නම් එම යෝජනාව ද න්‍යාය පත්‍රයෙන් ඉවත් කරන මෙන් මම ඉල්ලා සිටිනවා.

(5)(2)(3). ටෙරේශා මහත්මියගේ නිවස ළඟ සිට නෙළුම්පොකුණ ගම වොලිබෝල් පිටිය දක්වා ප්‍රධාන මාර්ගය (කන්නන්ගර කඩේ අසල සිට) මීටර් 450 ක් පමණ කොන්ක්‍රීට් ඇතිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(2)(4). මේසන් මහේෂ් මහතාගේ නිවසේ සිට අද්දරවත්ත බෝධිය දක්වා (තේක්කවත්ත සර්විස් එක ඉදිරිපිට පාර) මීටර් 350 ක් පමණ කොන්ක්‍රීට් ඇතිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(2)(5). ඇටවලවත්ත නැගෙනහිර 5 වන පටුමගේ ඉතිරි කොටසට කොන්ක්‍රීට් ඇතිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(2)(6). ඇටවලවත්ත නැගෙනහිර 11 වන පටුමගේ ඉඳුරුව මහ විද්‍යාලය හා දෙහිගහවෙලට යන පාරට කොන්ක්‍රීට් ඇතිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(2)(7). ඇටවලවත්ත බටහිර පාසල අසල චන්ද්‍රසේන නිකල්සන් යාපා මහතාගේ නිවස ඉදිරියේ ඇති මාර්ගයේ ඉතිරි කොටසට කොන්ක්‍රීට් ඇතිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(2)(8). තේල් වාඩිය හන්දියෙන් අකාඩිගොඩට යන පාර තාර යොදා සකසා දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

__ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා__
මේ මාර්ගය සකස් කර අවසන් කරපු පාරක්. මේ කියන අලුත්වැඩියා කළ යුතු කොටස තේල්වාඩිය පාරේ ගිලා බැස ඇති වේල්ල කොටස ලෙස සංශෝධනය විය යුතුයි.

__සංශෝධිත යෝජනාව ඉදිරිපත් කිරීම__
තේල්වාඩිය පාරේ ගිලා බැස ඇති වේල්ල කොටස ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සංශෝධිත යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(5)(3). __ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.__**

(5)(3)(1). බෙන්තොට ප්‍රාදේශීය සභාව සතු සියලුම පාරවල්වලට නාම පුවරු සැදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

__ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා__
බෙන්තර බල ප්‍රදේශයේ පාරවල් විශාල ප්‍රමාණයක නාම පුවරු නෑ. මේ නිසා මාර්ග හඳුනාගැනීමේ දී දැඩි අපහසුතාවයන්ට පත්වන අවස්ථා තියෙනවා. සම්පත්දායකයෙකු සම්බන්ධ කරගනිමින් එම අනුග්‍රහය යටතේ මෙම නාම පුවරු සකස් කර සවි කිරීම සුදුසුයි.

__ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා__
මෙතුමාගේ යෝජනාව ඉතාම හොඳයි. මං මතක් කරන්න කැමතී පසුගිය සභා කාලයේ දී යෝජනාවක් ස්ථිර කර ගත්තා පාරවල් නම් කිරීමේ දී පෞද්ගලික නම්වලින් පාරවල් නම් කරන්නේ නෑ කියලා. ඒ නිසා ඒ ගැනත් අවධානය යොමු කරමින් මෙම පාරවල්වල නාම පුවරු සකස් කරන්න කියලා ඉල්ලනවා.

__ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූශාන්ති මැතිතුමිය__
මං මේ වෙලාවේ මතක් කරන්න කැමතියි බෙන්තොට ආදාහනාගාරයේ නාම පුවරුවත් මේ සමඟම සකස් කරන්න කියලා.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 9.50 ට ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා ගරු සභාවට පැමිණෙන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**
මීට පෙර පැවති සභා කාලයේ දී එවැනි තීරණයක් අරගත්තා. ඒ වගේම මේ වන විට නම් කරලා භාවිතයේ තිබෙන පාරවල් සඳහා මෙය බලපාන්නේ නෑ. මේ කාර්යය සඳහා විශාල මුදලක් වැයවන නිසා සම්පත්දායකයන් සම්බන්ධ කර ගැනීම සුදුසුයි. මෙම පුවරු සැකසීමේ දී දිග, පළල, වර්ණය වැනි දෑ පිළිබඳ නිශ්චිත එකඟතාවයක් ලබාගෙන ඒ අනුව කටයුතු කරමු.

**<u>සංශෝධිත යෝජනාව ඉදිරිපත් කිරීම</u>**
බෙන්තොට ප්‍රාදේශීය සභාව සතු සියලුම පාරවල්වලට සම්පත්දායකයන් සම්බන්ධ කර ගනිමින් නාම පුවරු සැදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සංශෝධිත යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(5)(4).** **<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.</u>**

(5)(4)(1). හබුරුගල මහජන පුස්තකාලය ඉදිරිපිට වැසි සමයේ දී ජලය ඒකරාශී වීම වැළැක්වීමට වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට ගරු සභාවට යෝජනාකර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>**
ප්‍රාදේශීය සභා උප කාර්යාල භූමිය හා පුස්තකාල ගොඩනැගිල්ලට පිවිසෙන ස්ථානයේ පාරේ වර්ෂා කාලයේ දී ජලය රැඳී තිබෙනවා. වාහන ගමන් කිරීමේ දී මෙම ජලය පුස්තකාලය දෙසට ගමන් කරනවා. මෙය ගොඩනැගිල්ල වෙත ගමන් කිරීමට තිබෙන ප්‍රධාන ගේට්ටුව නිසා සේවා අවශ්‍යතා සඳහා පැමිණෙන ජනතාවත් අපහසුතාවයට පත් වෙනවා.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**
මේ මාර්ගය මාර්ග සංවර්ධධන අධිකාරිය සතු පාරක්.

**<u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා</u>**
මේ මාර්ගයේ නෙවෙයි ගැටලුව තියෙන්නේ. අපේ ගොඩනැගිල්ල මාර්ගයට වඩා පහතින් තිබෙන්නේ. ඒ නිසා තමයි වතුර රැඳෙන්නේ. පාරේ වාහන ගමන් කරන කොට වතුර පාර ගොඩනැගිල්ලට වදිනවා.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**
මේ සඳහා ගරු මන්ත්‍රීතුමා යෝජනා කරන වැඩපිළිවෙල කුමක් ද?

**<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>**
තාර හෝ කොරිපස් යොදා පාරේ මට්ටමට අපේ භූමිය සකස් කළොත් ජලය රැඳෙන එක නතර කර ගන්න පුළුවන්.

<u>**සංශෝධිත යෝජනාව ඉදිරිපත් කිරීම**</u>
හබුරුගල මහජන පුස්තකාලය ඉදිරිපිට වැසි සමයේ දී ජලය ඒකරාශී වීම වැළැක්වීමට තාර හෝ කොරිපස් යොදා භූමිය සකස් කිරීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සංශෝධිත යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(4)(2). බෙන්තොට පොදු ක්‍රීඩාංගනයේ ක්‍රිකට් ක්‍රීඩා කිරීමට හැකි පරිදි සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සාභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>**ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා**</u>
මේ ප්‍රදේශයේ ක්‍රිකට්, පාපන්දු වැනි තරඟ පැවැත්වීම සඳහා සුදුසු ක්‍රීඩාංගනයක් නැහැ. ඒ නිසා ගොඩක් පෞද්ගලික ආයතනවල සූදානම් කරන මෙවැනි තරඟ ප්‍රදේශයෙන් පිට ක්‍රීඩාංගනවල තමයි පැවැත්වෙන්නේ. මෙවැනි පුද්ගලික ආයතනවලින් සිදුකරන විවිධාකාරයේ තරාවලි, උත්සව ආදී කටයුතු සඳහා මත්පැන් ආදිය යොදා ගැනෙන නිසා පාසල් ක්‍රීඩාපිටි මේ සඳහා ලබා දෙන්නේ නෑ. ඒ නිසා අපේ ක්‍රීඩා පිටිය හොඳින් සංවර්ධනය කර මෙවැනි අවස්ථා සඳහා ලබා දීමට කටයුතු කළොත් අපිට හොඳ ආදායමක් මේ හරහා ලබා ගන්න පුළුවන්.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>
මම ස්තුතිවන්ත වෙනවා ගරු මන්ත්‍රීතුමාට මෙවැනි යෝජනාවක් ගෙන ඒම සම්බන්ධයෙන්. සභාවක් විදියට අපිට මේ වන විට අවශ්‍ය වන්නේ මුදල් උපාගත හැකි ආකාර. මේ ක්‍රීඩා පිටිය සකස් කිරීමේ කටයුතු සඳහා විශාල මුදලක් වැය වෙනවා. නමුත් ඒ හරහා සභාවට හොඳ ආදායමක් ලබා ගත හැකියි. මෙවැනි යෝජනා තව තවත් ලබා දෙන ලෙස මම සියලුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

<u>**ගරු මන්ත්‍රී, ඉන්දික සේරසිංහ මැතිතුමා**</u>
මේ ක්‍රීඩා පිටියේ මේ වන විට වොලිබෝල් පුහුණුවීම් සිදු කරන පුහුණුකරු ඉල්ලීමක් කළා ඔවුන් ක්‍රීඩා කරන තැන මේ දිනවල මඩවෙලා තියෙන නිසා එතනින් එහාට වෙන්න වැලි ටිකක් යොදලා සකස් කරලා දෙන්න කියලා.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>
ඒ පුහුණුකරු කවුද?. එම පුහුණුවීම් සඳහා ගාස්තුවක් අය කරනවද?

<u>**ගරු මන්ත්‍රී, ඉන්දික සේරසිංහ මැතිතුමා**</u>
රංජිත් කියලා පුහුණුකරුවෙක්. නොමිලේ තමයි ඔහු පුහුණුවීම් කටයුතු සිදු කරන්නේ.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(5)(5).** <u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා**</u>

(5)(5)(1). ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ 2025 වර්ෂය සඳහා ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ අනුමත පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

| අනු අංකය | ග්‍රාම නිලධාරී වසම | මාර්ගයේ නම | මාර්ගයේ දිග (මීටර්) | මාර්ගයේ පළල | අනුමත ප්‍රතිපාදන මුදල (රු.) |
|---|---|---|---|---|---|
| 01 | 14 ඒ මිරිස්වත්ත | කටුවත්ත සිට කැබැල්ලකන්ද දෙසට මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම | 220 | 3 | 4,310,000.00 |
| 02 | 12 එෆ් වියන්දූව | කැබැල්ලකන්ද සිට වියන්දූව දෙසට මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 210 | 2.7 | 2,970,000.00 |
| 03 | 12 ඊ ඇලකාක | එළුවහුගොඩ පාර සංවර්ධනය කිරීම (තාර හා කොන්ක්‍රීට්) | 370 | 2.7 | 3,380,000.00 |
| 04 | 10 කහවෙගම්මැද්ද | කහවෙගම්මැද්ද පවුල් සෞඛ්‍ය සේවා කාර්යාලය ඉදිරිපිටින් නෙළුම්පොකුණ දක්වා මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම | 141 | 2.4 | 1,530,000.00 |
| 05 | 14 ඊ ඇතුන්ගාගොඩ | තුඩුව පන්සල ඉදිරිපිටින් දිවෙන පාර (පැණිදන්වත්ත පාර) තාර දමා සංවර්ධනය කිරීම | 220 | 3.0/2.4 | 1,250,000.00 |
| 06 | 9 කයිකාවල | කයිකාවල සමෘද්ධි බැංකුව පාර තාර දමා සංවර්ධනය කිරීම | 280 | 3 | 1,460,000.00 |
| 07 | 9 බී ඇටවලවත්ත බටහිර | ඇටවලවත්ත දකුණ පාර හරස් මාර්ගයේ ඉතිරිව ඇති කොටස කොන්ක්‍රීට් කිරීම | 45 | 2.4 | 550,000.00 |
| 08 | මහ ඌරගහ | කරුණාරත්න මාවත තාර අතුරා සංවර්ධනය කිරීම | 605 | 3 | 5,000,000.00 |
| 09 | 6 දෙද්දුව | සෝමානන්ද මාර්ගයේ පළමු පටුමග (බේබි මහතාගේ කඩය ඉදිරිපිට සිට මහකුමාර මහතාගේ නිවස දක්වා) කොන්ක්‍රීට් කිරීම | 170 | 3.0/2.7 | 2,060,000.00 |
| 10 | 14 ඒ මිරිස්වත්ත | ග්‍රීන් ගාර්ඩ්න් මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම | 95 | 5.0/4.0 | 2,500,000.00 |

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(5)(2). බෙන්තොට ප්‍රාදේශීය සභා ඉඳුරුව උප කාර්යාලයේ මේ වන විට ගොඩගැසී ඇති පැරණි දිරාපත්ව ගිය ලිපි ලේඛන පරීක්ෂා කර බලා අපහරණය කිරීමට ලේඛන අපහරණ කමිටුවක් පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්තාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
මේ කමිටුව සඳහා පහත නිලධාරීන් මම යෝජනා කරනවා. ගරු මන්ත්‍රීතුමන්ලා ඒ පිළිබඳ විරුද්ධත්වයක් තිබෙනවා නම් අදහස් දක්වන්න.

| | |
|---|---|
| විමර්ශන නිලධාරී | - රසිකා මෙන්ඩිස් මිය |
| ප්‍රජා සංවර්ධන නිලධාරී | - වාසනා තරංගි මිය |
| කළමනාකරණ සේවා නිලධාරී | - වසන්තා ප්‍රියදර්ශනි මිය |
| කළමනාකරණ සේවා නිලධාරී | - චංචලා අබේසූරිය මිය |
| සංවර්ධන නිලධාරී | - තුෂාරා අමරසිංහ මිය |

<u>සංශෝධිත යෝජනාව ඉදිරිපත් කිරීම</u>
බෙන්තොට ප්‍රාදේශීය සභා ඉඳුරුව උප කාර්යාලයේ මේ වන විට ගොඩගැසී ඇති පැරණි දිරාපත්ව ගිය ලිපි ලේඛන පරීක්ෂා කර බලා අපහරණය කිරීමට පහත නිලධාරීන්ගෙන් සමන්විත ලේඛන අපහරණ කමිටුවක් පත් කිරීම සුදුසු බවට ගරු සභවට යෝජනා කර සිටිමි.

| | |
|---|---|
| විමර්ශන නිලධාරී | - රසිකා මෙන්ඩිස් මිය |
| ප්‍රජා සංවර්ධන නිලධාරී | - වාසනා තරංගි මිය |
| කළමනාකරණ සේවා නිලධාරී | - වසන්තා ප්‍රියදර්ශනි මිය |
| කළමනාකරණ සේවා නිලධාරී | - චංචලා අබේසූරිය මිය |
| සංවර්ධන නිලධාරී | - තුෂාරා අමරසිංහ මිය |

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සංශෝධිත යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(5)(3). බෙන්තොට දෝපේ ප්‍රාදේශීය සභා පෙර පාසලේ ඉගැන්වීම් කටයුතු සිදු කරන ඩබ්. කේ. අචිනි තරුෂිකා මෙනවිය පඩිපාලක සහා අවම වැටුප මත දෛනික පදනම යටතේ සේවයට බඳවා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>
දැනට දීමනාවක් යටතේ තමයි දෝපේ පෙර පාසලේ කටයුතු තනිව සිදු කරගෙන යන්නේ. අවශ්‍ය සුදුසුකම් ඇයට තිබෙනවා. ඒ නිසා දෛනික පදනම මත පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය යටතේ ඇයව සේවයට බඳවා ගැනීම සුදුසුයි.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(5)(4). 2025 බෙන්තොට ප්‍රාදේශීය සභා පෙර පාසල් දරු දැරියන්ගේ වර්ෂ අවසාන විවිධ ප්‍රසංගයේ හා ත්‍යාග ප්‍රදානෝත්සවයේ සංවිධාන කටයුතු සඳහා රු. 335,000/- ක ඇස්තමේන්තුගත මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(5)(5). ගෝනගල දොඹගහවත්ත ප්‍රධාන මාර්ගයේ හික්ගහවැටිය කොටස තාර දමා ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(5)(6).** <u>**ගරු මන්ත්‍රී, තිලක් උපුල් චමින්ද මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.**</u>

(5)(6)(1). මහ ඌරගහ පහළ කඩේ කැකිරිගස්හේන මාර්ගයේ සංවර්ධනය නොකර ඇති කොටස් සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>**ගරු මන්ත්‍රී, තිලක් උපුල් චමින්ද මැතිතුමා**</u>
මේ මාර්ගයේ බෑවුම් කොටස් සංවර්ධනය වෙලා නෑ.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(6)(2). මහ ඌරගහ ප්‍රධාන පාරේ සිට මඩකුඹුර මාර්ගයේ මීටර් 200 ක් පමණ දුරින් බෝධිය ළඟින් ඇති පටුවගොඩ මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී තිලක් උපුල් වමින්ද මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**ගරු මන්ත්‍රී, තිලක් උපුල් වමින්ද මැතිතුමා**
මේ මාර්ගය කන්දක් තියෙන්නේ. ගල් තලාවක්. මෙය සංවර්ධනය කිරීම සුදුසුයි.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

### (5)(7). ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.

(5)(7)(1). සභා බල ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් සිදුවෙමින් පවතින බවට මහජනතාව පවසන හෙයින් කාර්මික නිලධාරීන් යොදවා එවැනි දේ සිදු වී ඇත්දැයි පරීක්ෂා කරබලා ඒව වැළැක්වීමට හෝ නීත්‍යානුකූල කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා**
ගොඩක් වෙලාවට අවසර ගැනීමකින් තොරව තාප්ප ඉදි කිරීම් සිදු වෙනවා. මේවා පිළිබඳ සොයා බලා විධිමත් අයුරින් කටයුතු කිරීම සුදුසුයි. මේ හරහා ද සභාවට ආදායමක් උපයාගත හැකියි.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් බවට සභාව පත් කිරීම සුදුසු බවට කළ යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දුශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පෙ.ව. 10.15 ට කාරක සභා අවස්ථාව ආරම්භ විය.

මෙහි දී තාක්ෂණ සේවා නිලධාරී එම්. ඒ. එස්. ජයසිංහ මහතා විසින් අනවසර ඉදි කිරීම් සම්බන්ධවත් ඒවා නීත්‍යානුකූල කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධවත් විධිමත් පැහැදිලි කිරීමක් සිදු කරන ලදී.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභාව මහ සභාව බවට පත් කිරීමට කළ යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පෙ.ව. 10.25 ට කාරක සභාවේ කටයුතු අවසන් වී මහ සභාවේ කටයුතු ආරම්භ විය.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(7)(2). ජල සම්පාදන මණ්ඩලය මඟින් ලබා දෙන නල ජල මාර්ග සඳහා සභාවේ මාර්ගවලට හානිවීමේ දී අයකර ඇති මුදල් යොදවා වහාම එම හානි පූර්ණ කිරීමට පියවර ගතයුතු යැයි ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දුශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>**
කෝම්මල ප්‍රදේශයේ මෙවැනි පළුඳු වීම් විශාල ප්‍රමාණයක් තියෙනවා. ජනතාවගෙන් චෝදනාවකුත් එල්ල වෙනවා. පොඩි පොඩි පළුඳු වීම් තාර හෝ කොන්ක්‍රීට් යොදා පිළිසකර කරන්නයි තියෙන්නේ. මේ සඳහා ගතවන කාලය වැඩි වෙනකොට පාර කැඩි කැඩි ගොස් සිදුවන හානිය වැඩි වෙනවා.

**<u>ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූශාන්ති මැතිතුමිය</u>**
පසුගිය කාලයේ දී ඔබඩවත්ත ප්‍රදේශයේ, බද්දෙගමින් ලැබෙන ජලනල යෙදීමේ කටයුතු සිදු කිරීම නිසා පාර දෙපස දැඩි ලෙස අබලන් වෙලා තියෙනවා. මේ මාර්ගය ආදාහනාගාරයට ගමන් කිරීමට යොදා ගන්නවා. ඒ වගේම ගාමිණී ජාතික පාසල වෙත ගමන් කිරීමටත් මෙම පාර යොදා ගන්න නිසා පාසල් ළමුන් විශාල අපහසුතාවයකට පත් වෙනවා ගමන් කිරීමේ දී. මේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීමේ දී ඒ සඳහා ගෙවීමක් සිදු කරලා තියෙනවාද?. මුදල් ලැබිලා තියෙනවා නම් ඇයි මෙතෙක් එම අලුත්වැඩියා කටයුතු සිදු නොකළේ?. මෙම බට නළ එළිමේ කටයුතු සිදු කළේ සභාව නොමැති කාලයේ.

**<u>ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා</u>**
ඉඳුරුව ප්‍රදේශයෙත් මෙවැනි පළුඳු වීම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ජල සම්පාදන මණ්ඩලයෙන් ජලය ලබා ගැනීමේ දී මාර්ග සඳහා සිදුවන හානියට මුදල් අයකරගෙන තිබෙනවා. නමුත් මේ වන තෙක් මාර්ග අලුත්වැඩියා කටයුතු සිදු කරලා නෑ. ලොකු චෝදනාවක් එල්ල කරනවා ජනතාව සභාවෙන් මුදල් අය කර ගත්තත් පාරවල් හදලා නෑ කියලා.

**<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>**
තාර, කොන්ක්‍රීට්, කාපට් පාරවල් සියල්ල සඳහා අය කරන්නේ එකම ගාස්තුවක් ද?.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**
මේ මාර්ග සඳහා වෙන වෙනම අය කරනු ලබන මිල රේටයන් තිබෙනවා. පාරේ එක් පසක් පමණක් පළුඳු කරනවා නම් වෙනම මිල ගණනුත් පාර හරහා පළුඳු කරනවා නම් වෙනම මිල ගණනුත් තිබෙනවා.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(7)(3). මෙතෙක් සභාවට ඉදිරිපත් කරන ලද මන්ත්‍රී යෝජනා කඩිනමින් ඉටු කිරීමට පියවර ගතයුතු බවත් (කඩිනමින් ඉටු කළ යුතු යෝජනා) ඒවායේ ඉටු කිරීමේ ප්‍රගතිය හෝ ඉටු කිරීමේ තත්ත්වය පිළිබඳ වාර්තාවක් නොවැම්බර් මස මාසික රැස්වීමට ඉදිරිපත් කරන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි. (මාර්ග සම්බන්ධ යෝජනා හැර)

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න  මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>**
මේ වන තෙක් මහ සභා රැස්වීම්වල ඉදිරිපත් වූ යෝජනා සඳහා ක්‍රියාත්මක වීමේ දී මන්දගාමී ස්වභාවයක් පවතින නිසා මේ වන විට ලබාගෙන ඇති ප්‍රගතිය මීළඟ සභා වාරයේ දී ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(7)(4). බෙන්තොට කොට්ඨාසයේ පාසල්වල 2025 ශිෂ්‍යත්ව විභාගය සමතුන් ඇගයීම සඳහා උත්සවයක් සංවිධානය කර එම සිසුන් ඇගයීම සිදු කළ යුතු යැයි ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>**
බල ප්‍රදේශයේ පාසල්වල ශිෂ්‍යත්වය සමත් දරුවන් වෙනුවෙන් වැඩි වියදම් නොමැතිව කුඩා උත්සවයක් සංවිධානය කර එම සිසුන් ඇගයීමකට ලක් කිරීම වටිනවා. වචනයකින් හෝ එම දරුවන් දිරිමත් කිරීමට හැකියාවක් පවතිනව නම් වටිනවා.

**<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>**
බල ප්‍රදේශයේ සියලු ළමුන් ද නැතිනම් බල ප්‍රදේශයේ පාසල්වල ළමුන් ද මේ ඇගයීමට යොදා ගන්නේ කියලා දැනගන්න කැමතියි.

**<u>ගරු මන්ත්‍රී, උඩබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා</u>**
මෙම යෝජනාව හොඳයි. නමුත් පනත අනුව අධ්‍යාපනය සඳහා සීමිත ප්‍රතිපාදන වෙන්වෙලා තියෙන්නේ. මේ කාර්යය සඳහා වැඩි මුදලක් වැයවෙයි.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**
සභා අරමුදල් ප්‍රමාණය මත මෙවැනි උත්සවයක් සංවිධානය කිරීම අපිට මේ වෙලාවේ අමාරුයි. නමුත් ඒ දරුවන්ට අවශ්‍ය තෑගි ප්‍රමාණය සම්පත්දායකයන් සම්බන්ධ කරගනිමින් ලබා ගැනීමේ හැකියාව පවතිනවා නම් උත්සවය සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් ලබා දීමට හැකියි.

**<u>ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>**
මේ අදහස හොඳයි. පෙර පාසල් අපේ විෂය පථයට අයිති නමුත් ශිෂ්‍යත්ව ළමුන් අයිති නැති නිසා ප්‍රතිපාදන වෙනත් ආකාරවලින් සොයා ගැනීමට හැකියාව පවතිනව නම් මේ අගයීම් උත්සවය සංවිධානය කරමු.

**<u>ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා</u>**
සම්පත්දායකයින් සම්බන්ධ කරගනිමින් මෙම උත්සවය පවත්වමු.

**<u>සංශෝධිත යෝජනාව ඉදිරිපත් කිරීම</u>**
බෙන්තොට කොට්ඨාසයේ පාසල්වල 2025 ශිෂ්‍යත්ව විභාගය සමතුන් ඇගයීම සඳහා සම්පත්දායකයින් සම්බන්ධ කර ගනිමින් උත්සවයක් සංවිධානය කර එම සිසුන් ඇගයීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සංශෝධිත යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(5)(8). ගරු මන්ත්‍රී, තාරක විජේකොන් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.**

(5)(8)(1). මහගොඩ නාගහ උඩුමුල්ල පාර අවසාන කන්ද කොටස නිල්මිණී මහත්මියගේ නිවස අසල සිට ගාමිණී මහතාගේ නිවස අසල දක්වා මීටර් 40 ක් කොන්ක්‍රීට් කර දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(8)(2). මහගොඩ ගල්වැටියවත්ත පාර මීටර් 70 ක් කොන්ක්‍රීට් කර සාදා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(5)(9). ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.**

(5)(9)(1). බණ්ඩාරනායක මාවතේ සිට ඉඳුරුව දුම්රියපොළ ඉදිරිපසින් ගම තුළට විහිදී ඇති මාර්ගය තාර දමා ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා**
මෙය දුම්රියපොළ අසලින් ගල්බඩ ගම්මැද්ද වෙත පිවිසෙන පාරක්. ඒ වගේම ගල්බඩ අතුරුවැල්ල පාසලට ගමන් කළ ඇකි කෙටි මාර්ගයක්. අවසන් වරට ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරලා තියෙන්නේ 2002 වර්ෂයේ හිටපු සභාපති රංජිත් වික්‍රමසිංහ මැතිතුමාගේ කාලයේ. මේ වන විට පාර විශාල වශයෙන් කැඩී ගොස් තිබෙනවා. එම තැන් පිළිසකර කරනවාට වඩා සම්පූර්ණ මාර්ගයට නැවත අලුතින් තාර දැමීම වඩාත් සුදුසුයි.

**ගරු මන්ත්‍රී, නදීශාන් වික්‍රමරත්න මැතිතුමා**
ඒ වගේම මේ මාර්ගය ආරම්භක ස්ථානයේ බෝක්කුවක ගැටලුවක් තිබෙනවා. එයත් මේ සමඟම සකස් කිරීම සුදුසුයි.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(5)(10). ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.**

(5)(10)(1). බෙන්තොට ප්‍රාදේශීය සභා කාර්යාල පරිශ්‍රයේ, ආදාහනාගාර භූමියේ සහ කසල අංගනයේ ගොඩගැසී ඇති අබලි ද්‍රව්‍ය විධිමත් පරිදි බැහැර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා**
මේ කියන ස්ථානවල යකඩ ගොඩවල් ගොඩ ගැහිලා තියෙනවා. කසල අංගනයෙත් තියෙනවා තහඩු වගයක්. ආදාහනාගාරයෙත් තියෙනවා උළු කැට වගයක්. මේ වැනි දෑ වෙන්දේසියක් සිදු කොට සභාවට ආදායමක් ගෙනෙන අයුරින් ඉවත් කිරීම සුදුසුයි.

**සංශෝධිත යෝජනාව ඉදිරිපත් කිරීම**
බෙන්තොට ප්‍රාදේශීය සභා කාර්යාල පරිශ්‍රයේ, ආදාහනාගාර භූමියේ සහ කසල අංගනයේ ගොඩගැසී ඇති අබලි ද්‍රව්‍ය විධිමත් පරිදි බැහැර කිරීම සඳහා පහත නිලධාරීන්ගෙන් සමන්විත භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

| | |
|---|---|
| ගරු උප සභාපති | - ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා |
| ගරු මන්ත්‍රී | - මිගාර වලල්ලාවිට මැතිතුමා |
| පළාත් පාලන දෙපාර්තමේන්තු නිලධාරියෙක් | |
| සංවර්ධන නිලධාරී | - ශශිකලා දර්ශනී මිය |
| තාක්ෂණ සේවා නිලධාරී | - ආර්. ජේ. ඒස්. මාදුවාගොඩ මයා |
| සංවර්ධන නිලධාරී | - ලක්මාලි කෞෂල්‍යා මිය |
| කළමනාකරණ සේවා නිලධාරී | - උදාරා හෙට්ටිආරච්චි මිය |

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සංශෝධිත යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(5)(11). ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන කල් නොදුන් යෝජනා**

(5)(11)(1). 2026 වර්ෂය සඳහා සැපයුම් විෂය නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ කෙටුම්පත පිළිගැනීම සුදුසු බවටත් එම දැන්වීම දිනමිණ පුවත්පතේ අවම ඉඩ ප්‍රමාණයක සිංහල භාෂාවෙන් එක් වරක් පමණක් පල කිරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(11)(2). වෙන් කරන ලද නොදිරන කසල අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් 50% ක් කසල කළමනාකරණ කටයුතුවල නියැලෙන සේවකයන්ට ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මෙය එම කම්කරුවන්ට ලබා දෙන දිරි දීමනාවක්. නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ මෙම කටයුතු සිදු කරන්න බලාපොරොත්තු වෙනවා. මෙවැනි දිරමත් කිරීම් මඟින් ඔවුන් වඩාත් කැමැත්තෙන් මෙම කටයුතුවල නිරත වෙනවා. කසල වෙන් කිරීමේ කටයුතු සඳහා මේ වන විට අලුතෙන් කම්කරු සේවිකාවන් දෙදෙනෙකුත් යොදා ගන්නවා.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(11)(3). නව සභා වාරය ආරම්භ වී ඇති බැවින් සභාවේ තොරතුරු නිලධාරී ලෙස සභා ලේකම් වන පී. එච්. ටී. කේ. හේමචන්ද්‍ර මහත්මිය පත් කිරීම සුදුසු බවටත්, නම් කළ නිලධාරී වශයෙන් බෙන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති වන ප්‍රේමකුමාර විජේවර්ධන මහතා පත් කිරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(11)(4). පහළගම්භය බල ප්‍රදේශයේ අක්කර බදු සමීක්ෂණයක් පවත්වා එකී කමිටුව විසින් ඉදිරිපත් කර ඇති අක්කර බදු සමීක්ෂණ වාර්තාව පිළිගැනීම සුදුසු බවටත් ඒ අනුව 2026 වර්ෂයේ සිට අක්කර බදු ලේඛනයක් සකස් කිරීමටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(11)(5). ප්‍රවාහන, මහා මාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ 2025 වර්ෂය සඳහා ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ අනුමත වී ඇති පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා එකඟතාවය ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

| අනු අංකය | ග්‍රාම නිලධාරී වසම | මාර්ගයේ නම | සංවර්ධනය කළ යුතු දුර (මීටර) | පළල (මීටර) | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | ඇස්තමේන්තු මුදල (රු.) |
|---|---|---|---|---|---|---|
| 01 | 12ඊ ඇලකාක | එළුවහුගොඩ පියැද්ද පාර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම | 32 | 2.5 | 50 | 386,710.25 |
| 02 | 10 කහවෙගම්මැද්ද | මහපැලැන නෙළුම් පොකුණ පාර කොන්ක්‍රීට් කිරීම (පද්මිණී මහත්මියගේ නිවස සිට විපුලසේන මහතාග් නිවස දක්වා) | 18 | 2.4 | 50 | 287,000.00 |
| 03 | 14ඊ ඇතුන්ගාගොඩ | කනහින්තොට සිට ඇලකාක පාසල් මාවතේ බෝක්කුව ඉදිකර මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 25 | 3 | 1000 | 820,000.00 |
| 04 | 14ඊ ඇතුන්ගාගොඩ | කනහින්තොට සිට ඇලකාක පාසල් මාවතේ පැතිබැම්ම ඉදි කරමින් මාර්ගය සංවර්ධනය කිරීම | 25 | | 1000 | 906,572.81 |
| 05 | 6 දෙද්දුව | විලියම් ගුණරත්න මාවත අබලන්ව ඇති කොටස (යූ. කේ. ගුණවතී නිවස සිට පත්මසිරි පෙරේරා නිවස දක්වා මාර්ග) කොටස කොන්ක්‍රීට් කිරීම | 55 | 2.7 | 70 | 882,248.12 |

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(5)(11)(6). කසල අංගනයේ මායිම් වැට සහ බැම්ම ඉදි කිරීම සඳහා තෝරාගත් ලංසුකරු වන එච්. එස්. කේ. බිල්ඩර්ස් ආයතනය ඉදිරිපත් කළ රු. 6,324,770/- ක මිල සඳහා 2% ක වට්ටමක් ලබා දීමට එකඟතාවය පල කර ඇති බැවින් එම නව මිල ගණන් යටතේ මෙම ඉදි කිරීම සිදු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
පසුගිය දිනවල අපි ටෙන්ඩර් කරා කසල අංගනයේ මායිම් වැටයි හොරවල තොටුපළ පාරයි. ඒ සඳහා කොන්ත්‍රාත්කරුවන් විසි ගණනකට මිල ගණන් යොමු කළත් දෙදෙනායි ටෙන්ඩර් ලබා දුන්නේ. ඒ අතරින් හොරවල තොටුපළ සඳහා ලබා දුන් ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා කොන්ත්‍රාත්කරුගේ ඇස්තමේන්තු මුදල විශාලයි. අපිට නැවත වරක් ටෙන්ඩර් කරන්න කාලයක් තිබුණේ නෑ. එහෙම කරොත් අපිට ඒ සඳහා ලැබුණ මුදල් නැති වෙනවා. අපිට ඒ අනුව ගන්න පුළුවන් ක්‍රියාමාර්ග 02 යි තිබුණේ. එකක් තමයි කොන්ත්‍රාත්කරුගේ ඇස්තමේන්තු මුදල ඉංජිනේරු ඇස්තමේන්තු මුදලට සකස් කර ගන්න ඕන. නැතිනම් කොන්ත්‍රාත්කරු එකඟ කර ගන්න ඕන වට්ටමක් ලබා දෙන්න කියලා. ඒ අනුව ඒ කොන්ත්‍රාත්කරු එකඟතාවය පළ කරලා තියෙනවා ලිඛිතව 2% ක වට්ටමක් ලබා දීමට. ඒ වට්ටම අනුව මෙම කොන්ත්‍රාත්තුව සිදු කිරීම සුදුසුයි.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 11.00 ට ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය සභා ගර්භයෙන් පිටව යන ලදී.

(5)(11)(7). අප ආයතනය මඟින් බෙන්තොට ලංකා බැංකුවේ පත්වාගෙන යන ජංගම ගිණුම්වල නිරන්තරයෙන් විශාල මුදල් ශේෂයක් පවතින අතර ඒ සඳහා කිසිදු පොලී මුදලක් හිමි නොවේ. එබැවින් සභාවට මූල්‍යමය ප්‍රතිලාභයක් ලැබෙන පරිදි එම ජංගම ගිණුම්වල ශේෂය එකී ගිණුම් පවත්වාගෙන යනු ලබන බෙන්තොට ලංකා බැකුවේ චක්‍රීය මුදල් කළමනාකරණ ක්‍රමය (Revolving Fund Management) යටතේ සිදු කිරීම සුදුසු බවටත්, එම ගිණුම් මෙහෙයවීමේ බලය සභාවේ ලේකම් පී. එච්. ටී. කේ. හේමචන්ද්‍ර මියට හා ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී ටී. ජී. ජී. ලක්මාලි මියට පැවරීමටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

| | |
|---|---|
| කර්මාන්ත ගිණුම | - 2758780 |
| පොදු ගිණුම | - 2759057 |

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

- මෙම අවස්ථාවේ දී ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය ගරු සභාවෙන් පිටව යන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
අපේ සභාවේ ගිණුම් පවතින්නේ ජංගම ගිණුම් විදියට. මේ නිසා ගිණුම්වල ශේෂයට අපිට පොලියක් ලැබෙන්නේ නෑ. සමහර අවස්ථාවල මෙම ගිණුම්වල විශාල ප්‍රමාණයක ශේෂයක් පෙන්නුම් කරත් පොලියක් නොලැබෙන නිසා අපිට අවාසියි. ඒ නිසා මේ ගිණුම් ඉතිරි කිරීමෙ ගිණුම් බවට මාර කරන්න තමයි යෝජනා කළේ.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් බවට සභාව පත් කිරීම සුදුසු බවට කළ යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පෙ.ව. 11.00 ට කාරක සභා අවස්ථාව ආරම්භ විය.

**<u>ලේකම් පී. එච්. ටී. කේ. හේමචන්ද්‍ර මිය</u>**
අපේ හැම ගිණුමක්ම තියෙන්නේ ජංගම ගිණුම් විදියට. පහුගිය දිනවල බැලුවොත් හැම වෙලේම කෝටිය ඉක්මවලා මුදල් තිබුණා එම ගිණුම්වල. මුද්දර ගාස්තු ලැබුණ වෙලාවට කෝටි 02 ක් වත් මුදල් එම ගිණුම්වල සතියක කාලයක්වත් රැඳෙනවා ස්ථාවර තැන්පතුවලට මාරු කරන තෙක්. සමහර සභාවල දැනටමත් මේ දේ කරනවා. හවසට මුදල් මාරු කරනවා ඉතිරි කිරීමේ ගිණුමට. නැවත උදේ වෙනකොට සම්පූර්ණ මුදලම ජංගම ගිණුමට ලැබෙනවා. අපිට පොළියක් ලැබෙනවා මාසෙ අන්තිමට. නැත්තම් තව ක්‍රමයක් තිබෙනවා. අපිට පුළුවන් ලක්ෂ 10 ක් පමණ ජංගම ගිණුමේ රඳවාගෙන ඉතිරි මුදල් ඉතිරි කිරීමේ ගිණුමට බැර කරන්න. එතකොට අපි ලක්ෂ 10 ට වැඩි චෙක්පතක් නිකුත් කරන කොට ඒ අඩු ගාන ඉතිරි කිරීමේ ගිණුමෙන් ජංගම ගිණුමට මාරු වෙනවා. අපේ පහසුව සඳහා මුදල් පොත් දෙකක් පවත්වාගෙන යන්න පුළුවන්. නමුත් එක බැංකු සැසඳුමයි සකස් වෙන්නේ. අනිත් ගිණුමෙන් කිසිම චෙක්පත් නිකුත් කිරීමක් සිදු වෙන්නේ නෑ.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභාව මහ සභාව බවට පත් කිරීමට කළ යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පෙ.ව. 11.08 ට කාරක සභාවේ කටයුතු අවසන් වී මහ සභාවේ කටයුතු ආරම්භ විය.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(6) <u>කාරක සභාවල වාර්තා සලකා බැලීම</u> :-**

**(6)(1). 2025.09.09 දිනැති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාවට ඉදිරිපත් කිරීම.**

2025.09.09 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

## <u>2025.09.09 දින පෙ.ව.9.00 ට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සංක්ෂිප්ත වාර්තාවයි.</u>

සහභාගීත්වය -

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. කේ.ඩී.මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
3. රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා - ගරු මන්ත්‍රී
4. නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී
5. ඩී.ඩී.නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
6. බී. සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා - ගරු මන්ත්‍රී

**ගෙවීම් අනුමත කිරීම.**
පහත සඳහන් ගෙවීම් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | ගෙවන මුදල රුපියල් |
|---|---|---|---|---|
| 01 | 15 | පෝස්ට් මාස්ටර් ජනරාල් 013-1001-99027346 | තැපැල් මුද්‍රා යන්ත්‍රයට මුද්දර පහසුකම් ඇතුළත් කිරීම. | 20,000.00 |
| 02 | 16 | මහජන බැංකුවේ ඕ.වී. කසුනි ගයාත්‍රි විතාන ගි.අ. 084200110042370 | 2025 අගෝස්තු මස දෛනික වැටුප් ගෙවීම. | 22,070.00 |
| 03 | 17 | ලංකා බැංකුවේ එම්.ඩී. පැතුම් තරංග අබේරත්න ගි.අ. 78441739 | 2025 අගෝස්තු මස දෛනික වැටුප් ගෙවීම. | 19,288.35 |
| 04 | 18 | ලංකා බැංකුවේ ඩබ්.කේ. අචිනි තරුෂිකා ගි.අ. 87113036 | 2025 අගෝස්තු මස දෛනික වැටුප් ගෙවීම. | 26,000.00 |
| 05 | 19 | කේ. දම්මිත් වාද්දුවගේ | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 4,558.00 |
| 06 | 20 | බී.නුවන් ධනුෂ්ක උපාලි | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 504.00 |
| 07 | 21 | ඒ.කේ.ටී. නිරුෂානි | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 784.00 |
| 08 | 22 | බී.නුවන් ධනුෂ්ක උපාලි | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 688.00 |
| 09 | 23 | එච්. උදයංගනී මහේසිකා | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 1,162.00 |
| 10 | 24 | ගාමිණී සමරවීරහෙට්ටි | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 420.00 |
| 11 | 25 | කේ.එල්.එස්. නිලක්ෂි | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 1,032.00 |
| 12 | 26 | එම්.එස්.ඩී. චන්දිම ප්‍රියංකර | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 1,680.00 |
| 13 | 27 | කසුන් උදාර | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 3,028.00 |
| 14 | 28 | බී. ජනක ජීවවර්ණ | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 1,050.00 |
| 15 | 29 | ඕ.වී.කේ. ගයාත්‍රි | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 1,198.00 |
| 16 | 30 | කේ.ඩබ්.ඩී. නෙරංජි මහේෂිකා | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 1,198.00 |

| | | | | |
|---|---|---|---|---|
| 17 | 31 | ටී.ජී.සී. උදයංගනී | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 1,274.00 |
| 18 | 32 | ආර්.ජේ.එස්. මාදුවාගොඩ | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 586.00 |
| 19 | 33 | මුදිත ධර්ම ගුණසේකර | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 16,094.25 |
| 20 | 34 | කේ.අජිත් ජයරත්න | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 28,899.99 |
| 21 | 35 | එස්.කේ.ජානක | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 13,333.33 |
| 22 | 36 | එම්. නිලංක | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 16,166.66 |
| 23 | 37 | කේ.ඒ. කෝසල | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 15,323.33 |
| 24 | 38 | එම්.කේ. අමිල රුවන් | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 4,405.45 |
| 25 | 39 | ගාමිණී අබේවික්‍රම | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 12,781.24 |
| 26 | 40 | ඉන්දික හෙට්ටිගොඩ | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 3,583.49 |
| 27 | 41 | එම්.කේ. දර්ශන ප්‍රදීප් | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 17,166.66 |
| 28 | 42 | පී.ඩී. රුවන් කුමාර | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 11,403.12 |
| 29 | 43 | කේ.ඕ.කේ. රවි | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 4,059.91 |
| 30 | 44 | එච්.එම්. දිලුනි භාග්‍යා | 2025 ජූලි මස අතිකාල දීමනා ගෙවීම. | 1,416.66 |
| 31 | 45 | යූ.කේ. නදීශ ආරියරත්න | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 6,118.74 |
| 32 | 46 | එල්.එච්. ලලිත් | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 4,032.96 |
| 33 | 47 | මහේෂ් පුබුදු | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 11,499.99 |
| 34 | 48 | දූවගේ රාහුල | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 13,483.33 |
| 35 | 49 | ඩී.එම්.පී.කේ. නානායක්කාර | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 9,349.16 |

| | | | | |
|---|---|---|---|---|
| 36 | 50 | එච්.එල්.වජිර රංජන් | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 9,088.38 |
| 37 | 51 | ගාමිණි සමරවීරහෙට්ටි | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 19,250.00 |
| 38 | 52 | බී. ජනක | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 3,119.37 |
| 39 | 53 | ඩී.පී.අයි. ප්‍රියංකර | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 6,684.37 |
| 40 | 54 | එච්.එම්. දිලුනි භාග්‍යා | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 1,499.99 |
| 41 | 55 | කේ.යූ. සාගර | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 15,403.33 |
| 42 | 56 | කසුන් උදාර | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 19,999.00 |
| 43 | 57 | එච්.ඒ. සුනිල් | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 19,455.41 |
| 44 | 58 | චාමින්ද අබේවික්‍රම | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 3,999.99 |
| 45 | 59 | කේ.දම්මිත් | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 14,333.33 |
| 46 | 60 | එම්.ඩබ්. අජිත් කුමාර | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 17,151.04 |
| 47 | 61 | ඉසුරු ප්‍රසාද් | 2025 ජූලි මස අතිකාල දීමනා ගෙවීම. | 1,112.49 |
| 48 | 62 | එම්.එස්.ඩී. චන්දිම ප්‍රියංකර | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 14,833.33 |
| 49 | 63 | එම්.එස්. ගුණසේකර | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 21,601.04 |
| 50 | 64 | කේ.ඒ. සනත් සුසන්ත | 2025 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම. | 9,038.33 |
| 51 | 65 | බී.නුවන් ධනුෂ්ක උපාලි | 2025 අගෝස්තු මස පරිවර්තිත ගමන් වියදම් දීමනා ගෙවීම. | 5,200.00 |
| 52 | 66 | එස්.ඩී. සමරනායක | 2025 අගෝස්තු මස පරිවර්තිත ගමන් වියදම් දීමනා ගෙවීම. | 8,000.00 |
| 53 | 67 | එම්.ඒ. සංජය ජයසිංහ | 2025 අගෝස්තු මස පරිවර්තිත ගමන් වියදම් දීමනා ගෙවීම. | 9,000.00 |
| 54 | 68 | ආර්.ජේ.එස්. මාදුවාගොඩ | 2025 අගෝස්තු මස පරිවර්තිත ගමන් වියදම් දීමනා ගෙවීම. | 9,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 55 | 69 | ඩී.වී. තරංගි | 2025 ජූලි මස පරිවර්තිත ගමන් වියදම් දීමනා ගෙවීම. | 5,000.00 |
| 56 | 70 | මුදල් භාරකරු<br>ඩී.වී. තරංගි | පළාත් පාලන සතියට සමගාමීව පවත්වන ආයුර්වේද සායනයේ සංවිධාන කටයුතු සඳහා අත්තිකාරම් මුදල් ලබාදීම. | 13,000.00 |
| 57 | 71 | මුදල් භාරකරු<br>එම්.ඩබ්. අජිත් | ගරු සභාපතිතුමාට සහ ගරු උපසභාපතිතුමාට නිල මුද්‍රා සැකසීම වෙනුවෙන් අත්පිට දරන ලද වියදම් මුදල් ප්‍රතිපූර්ණය කිරීම. | 4,500.00 |
| 58 | 72 | මුදල් භාරකරු<br>ජී.අයි. කුමාරසිංහ | විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වෙනුවෙන් පවත්වන කියවීමේ වැඩසටහනට හා ඔවුන්ගේ දෙමාපියන් වෙනුවෙන් පවත්වනු ලබන ධනාත්මක ආකල්ප වැඩිදියුණු කිරීමේ වැඩසටහනට අවශ්‍ය සංග්‍රහ වියදම් සඳහා අත්තිකාරම් මුදල් ලබාගැනීම. | 4,250.00 |
| 59 | 73 | මුදල් භාරකරු<br>ජී.අයි. කුමාරසිංහ | දෙද්දුව ප්‍රාථමික විද්‍යාලයේ පවත්වනු ලැබූ ආකල්ප සංවර්ධන වැඩසටහනට අදාළව සංග්‍රහ කටයුතු හා සම්පත්දායක දීමනා වෙනුවෙන් වියදම් වූ මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීම. | 7,890.00 |
| 60 | 74 | මුදල් භාරකරු<br>පී.එච්.ටී.කේ. හේමචන්ද්‍ර | පළාත් පාලන සතිය නිමිත්තෙන් සිදුකරනු ලබන වැඩසටහන් සඳහා අත්තිකාරම් මුදල් ලබාගැනීම. | 80,000.00 |
| 61 | 75 | මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව | සැලසුම් කමිටුවට සහභාගි වීම වෙනුවෙන් දීමනා ගෙවීම. 2025.08.07, 2025.08.14, 2025.08.22 | 50,250.00 |
| 62 | 76 | මුදල් භාරකරු<br>ලක්ෂානි නිවන්තිකා | 2025.08.27 දින කුඩා ඌරගහ ජංගම පුස්තකාලය මඟින් සිදුකරනු ලැබූ පුස්තකාල ප්‍රවර්ධන වැඩසටහන සඳහා අතින් වියදම් වූ මුදල් ප්‍රතිපූර්ණය කරගැනීම. | 1,800.00 |
| 63 | 77 | මුදල් භාරකරු<br>මාලනී ගුණරත්න | 2025.09.19 දින සිදුකිරීමට යෝජිත පාසල් ජනමාධ්‍ය පුහුණු වැඩමුළුව සඳහා අත්තිකාරම් මුදල් ලබාගැනීම. | 30,000.00 |
| 64 | 78 | මුදල් භාරකරු<br>මාලනී ගුණරත්න | 2025.08.26 දින පැවැත්වූ කියවීම හා කථන ක්‍රියාකාරකම් වැඩසටහන සඳහා අතින් වියදම් වූ මුදල් ප්‍රතිපූර්ණය කිරීම. | 9,690.00 |
| 65 | 79 | මුදල් භාරකරු<br>ඩී.ඩී. සතාරා නදීශානි | කසළ අධීක්ෂණ කටයුතු වෙනුවෙන් නිවාඩු දින වැටුප් ගෙවීම. | 9,954.66 |

| | | | | |
|---|---|---|---|---|
| 66 | 80 | මුදල් භාරකරු<br>ඩී.ඩී. සතාරා නදීශානි | තාක්ෂණ සේවා නිලධාරි නිල ඇඳුම් සඳහා අවශ්‍ය බොත්තම්, නිල ලාංඡන මිලදීගැනීම වෙනුවෙන් අත්පිට දරන ලද වියදම් මුදල් ප්‍රතිපූර්ණය කිරීම. | 3,355.00 |
| 67 | 81 | මුදල් භාරකරු<br>සංජය ජයසිංහ | තාක්ෂණ සේවා නිලධාරි නිල ඇඳුම් සඳහා අවශ්‍ය බොත්තම්, නිල ලාංඡන මිලදීගැනීම වෙනුවෙන් අත්පිට දරන ලද වියදම් මුදල් ප්‍රතිපූර්ණය කිරීම. | 3,805.00 |
| 68 | 82 | මුදල් භාරකරු<br>කසුන් උදාර | යතුරු රාජකාරි කිරීම වෙනුවෙන් ගමන් වියදම් ගෙවීම. | 2,268.00 |
| 69 | 83 | මුදල් භාරකරු<br>කේ.යූ. සාගර | 2025.08.15 දින LL 7293 ජල බවුසරය සඳහා 6000 L ජලය ලබාගැනීම වෙනුවෙන් අත්පිට දරන ලද මුදල් ප්‍රතිපූර්ණය කිරීම. | 1,416.00 |
| 70 | 84 | මුදල් භාරකරු<br>එස්.ඩී. සමරනායක | තාක්ෂණ සේවා නිලධාරි නිල ඇඳුම් සඳහා අවශ්‍ය බොත්තම්, නිල ලාංඡන මිලදීගැනීම වෙනුවෙන් අත්පිට දරන ලද වියදම් මුදල් ප්‍රතිපූර්ණය කිරීම. | 2,805.00 |
| 71 | 85 | මුදල් භාරකරු<br>කේ.යූ. සාගර | 2025.09.04 දින LL 7293 ජල බවුසරය සඳහා 6000 L ජලය ලබාගැනීම වෙනුවෙන් අත්පිට දරන ලද මුදල් ප්‍රතිපූර්ණය කිරීම. | 1,416.00 |
| 72 | 86 | මුදල් භාරකරු<br>ආර්.ජේ.එස්. මාදුවාගොඩ | තාක්ෂණ සේවා නිලධාරි නිල ඇඳුම් සඳහා අවශ්‍ය බොත්තම්, නිල ලාංඡන මිලදීගැනීම වෙනුවෙන් අත්පිට දරන ලද වියදම් මුදල් ප්‍රතිපූර්ණය කිරීම. | 3,805.00 |
| 73 | 87 | මුදල් භාරකරු<br>මෙනුරි යශෝධා වික්‍රමරත්න | 2025 අගෝස්තු මස පරිගණක පුහුණු දීමනා ගෙවීම. | 5,000.00 |
| 74 | 88 | මුදල් භාරකරු<br>එස්.ඩී. සමරනායක | ඉඳුරුව උපකාර්යාලයේ දොර අගුළු සවිකිරීම සඳහා අතින් දරන ලද වියදම් මුදල් ප්‍රතිපූර්ණය කිරීම. | 2,800.00 |
| 75 | 89 | මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව | ප්‍රධාන කාර්යාලයේ සුලු මුදල් අත්තිකාරම ප්‍රතිපූර්ණය කිරීම. | 9,680.00 |
| 76 | 90 | මුදල් භාරකරු<br>ඩී.ඩී. සතාරා නදීශානි | 2025.08.19 දින සිට සේවය කිරීම වෙනුවෙන් නුපුහුණු සේවකයන් සඳහා වැටුප් ගෙවීම. | 48,000.00 |
| 77 | 91 | මොබිටෙල් පුද්ගලික සමාගම | 071-7913428 දුරකතනයේ WIFI බිල්පත හා 071-4920312 දුරකතනයේ SMS බිල්පත පියවීම. | 5,141.11 |

| | | | | |
|---|---|---|---|---|
| 78 | 92 | ලංකා විදුලිබල මණ්ඩලය | ප්‍රධාන කාර්යාලයේ,කාර්යාල පරිශ්‍රයේ,වැඩ ඒකකයේ විදුලි බිල පියවීම.<br>2025.07.30-2025.08.30, 2025.07.29-2025.08.29 | 17,146.66 |
| 79 | 93 | ලංකා විදුලිබල මණ්ඩලය | හබුරුගල උප කාර්යාර්යාලයේ විදුලි බිල පියවීම. 2025.07.28-2025.08.25 | 3,307.69 |
| 80 | 94 | ලංකා විදුලිබල මණ්ඩලය | දෝපේ පෙර පාසලේ විදුලි බිල පියවීම. 2025.08.05 - 2025.09.04 | 538.46 |
| 81 | 95 | ලංකා විදුලිබල මණ්ඩලය | බෙන්තොට මහජන පුස්තකාලයේ, කඩකාමර කොරිඩෝවේ, පියවර පෙර පාසලේ විදුලි බිල පියවීම. 2025.07.29 – 2025.08.28,<br>2025.08.01 – 2025.09.02 | 4,717.94 |
| 82 | 96 | ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී | 034-4475419 දුරකතනයේ බිල හා 034-2290646 දුරකතනයේ ෆැක්ස් බිල පියවීම.<br>2025.07.01 – 2025.07.31 | 15,385.74 |
| 83 | 97 | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | බෙන්තොට මහජන පුස්තකාලයේ, කාර්යාල පරිශ්‍රයේ ජල බිල පියවීම.<br>2025.07.16 – 2025.08.16,<br>2025.05.29 – 2025.06.25 | 4,594.14 |
| 84 | 98 | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | ප්‍රධාන කාර්යාලයේ, ආදාහනාගාරයේ, කාර්යාල පරිශ්‍රයේ ජල බිල පියවීම.<br>2025.07.24 – 2025.08.23,<br>2025.08.01 – 2025.09.01 | 10,668.06 |
| 85 | 99 | ලංකා බැංකුවේ සම්පත් සිදත් ශ්‍රී කණහැරආරච්චි ගි.අ. 87743598 | 252-6569 කැබ්රථයේ සිදුකරන ලද අලුත්වැඩියාවට අදාළ 10% රැඳවුම් මුදල නිදහස් කිරීම. | 423,895.00 |
| 86 | 100 | ලංකා බැංකුවේ සම්පත් සිදත් ශ්‍රී කණහැරආරච්චි ගි.අ. 87743598 | RD 4484 ට්‍රැක්ටර් රථය සඳහා අවශ්‍ය 12/04-28 ප්‍රමාණයේ ටියුබ් 02 ක් හා 600*18 ප්‍රමාණයේ ටියුබ් 02 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම. | 28,600.00 |
| 87 | 101 | පෝස්ට් මාස්ටර් ජනරාල් 013-1001-99027346 | තැපැල් මුද්‍රා යන්ත්‍රයට මුද්දර පහසුකම් ඇතුළත් කිරීම. | 20,000.00 |
| 88 | 102 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය, බේරුවල | ඉන්ධන බිල්පත් පියවීම.<br>2025.08.02- 2025.08.18 | 263,625.25 |

<table>
<tr><td></td><td></td><td></td><td>
<table>
<tr><th>වාහන අංකය</th><th>මුදල රු.</th></tr>
<tr><td>PF 7388</td><td>35,258.00</td></tr>
<tr><td>252-6569</td><td>11,560.00</td></tr>
<tr><td>LD 8614</td><td>43,350.00</td></tr>
<tr><td>JR 7724</td><td>7,367.25</td></tr>
<tr><td>RD 4484</td><td>20,230.00</td></tr>
<tr><td>RD 6208</td><td>28,900.00</td></tr>
<tr><td>RE 9232</td><td>40,460.00</td></tr>
<tr><td>LL 7293</td><td>60,979.00</td></tr>
<tr><td>තණකොළ කපන මැෂිම</td><td>11,716.00</td></tr>
<tr><td>ධූමායන යන්ත්‍රය (MOH)</td><td>3,805.00</td></tr>
<tr><td>එකතුව</td><td>263,625.25</td></tr>
</table>
</td><td></td></tr>
<tr><td>89</td><td>103</td><td>LC Printers & Advertising (PVT) LTD</td><td>කසල බඳුන්වල ප්‍රදර්ශනය කිරීම සඳහා 18"*8" ප්‍රමාණයේ පුවරු 04 ක් සැකසීම වෙනුවෙන් ගෙවීම.</td><td>5,000.00</td></tr>
<tr><td>90</td><td>104</td><td>Kushani Metal Craft</td><td>RD 6208 ට්‍රැක්ටර් රථයේ රියදුරු ආසනය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම.</td><td>22,000.00</td></tr>
<tr><td>91</td><td>105</td><td>Infotec Office Automation</td><td>ගබඩාව සඳහා HP 10089 Toner 03 ක් මිලදීගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම.</td><td>25,500.00</td></tr>
<tr><td>92</td><td>106</td><td>මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව</td><td>ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සඳහා ඉන්ධන දීමනා ගෙවීම. 2025 අගෝස්තු</td><td>66,000.00</td></tr>
<tr><td>93</td><td>107</td><td>මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව</td><td>ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සඳහා මන්ත්‍රී දීමනා ගෙවීම. 2025 අගෝස්තු</td><td>200,000.00</td></tr>
<tr><td>94</td><td>108</td><td>මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව</td><td>ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සඳහා දුරකතන දීමනා ගෙවීම. 2025 අගෝස්තු</td><td>24,500.00</td></tr>
<tr><td>95</td><td>109</td><td>මුදල් භාරකරු<br>සී.අයි.ඩී.ජ්. වීරසේකර</td><td>2025.09.16 දින පැවැත්වීමට නියමිත මාසික මහ සභා රැස්වීමේ සංග්‍රහ කටයුතු වෙනුවෙන් අත්තිකාරම් ලබා ගැනීම.</td><td>15,000.00</td></tr>
<tr><td>96</td><td>110</td><td>ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ඩබ්.ඩී.එස්.එල්. සමරසිංහ ගි.අ. 215010900410</td><td>ආදාහනාගාර ක්‍රියාකරු හා සහායක නිල ඇඳුම් ලබාදීම වෙනුවෙන් බිල්පත් පියවීම.</td><td>22,000.00</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| 97 | 111 | U.K.G. Enterprises | Traffic Cone 10 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම. | 27,500.00 |
| 98 | 112 | SKM Tyres (PVT) Ltd | PF 7388, RD 4484 වාහන සඳහා මිලදීගත් ටයර් වෙනුවෙන් බිල්පත් පියවීම. | 430,012.20 |
| 99 | 113 | සී/ස රෙඩ් ඊගල්ස් ආරක්ෂක සේවා (පුද්) සමාගම | 2025 අගෝස්තු මස ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් ගෙවීම. | 162,689.55 |
| 100 | 114 | මුදල් භාරකරු<br>පී.පී. සිරිමාන්න | ආහාර පනතේ කටයුතු වෙනුවෙන් 2025.03.14 දිනැතිව වවුචර් අංක 64 න් ලබාගත් අත්තිකාරම පියවීම. | (5,000.00) |
| 101 | 115 | මුදල් භාරකරු<br>සී.අයි.ඩී.ඒ. වීරසේකර | 2025.08.19 දින පැවැත්වූ මාසික මහ සභා රැස්වීමේ සංග්‍රහ කටයුතු වෙනුවෙන් 2025.08.18 දින වවුචර් අංක 84 න් ලබාගත් අත්තිකාරම පියවීම. | (15,000.00) |
| 102 | 116 | A.M. Enterprises (PVT) Ltd | PF 7388 කැබ්රථයේ වාරසේවාව සිදුකිරීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 42,615.00 |
| 103 | 117 | Integrated Micro Systems (PVT) Ltd | ගි/09 විෂයට අයත් UPS යන්ත්‍රය සඳහා නව බැටරියක් සවිකිරීම සහ පරිගණක යන්ත්‍ර 05 ක් සඳහා Virus Guard දැමීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 17,200.00 |
| 104 | 118 | චමින්ද ඉලෙක්ට්‍රිකල්ස් | Orange 20W LED IP65 බල්බ 500 ක් වෙනුවෙන් ගෙවීම් කිරීම. | 845,000.00 |
| 105 | 119 | එච්.ඩී. මෙත්තානන්ද | හබුරුගල මහජන පුස්තකාලයට හා තුන්දුව කියවීම් ශාලාවට පුවත්පත් සැපයීම වෙනුවෙන් බිල්පත් පියවීම. 2025 අගෝස්තු | 17,230.00 |
| 106 | 120 | ලංකා බැංකුවේ ජී.ඒ.කේ. වසන්ත ගි.අ. 9541320 | කසල අංගනයේ කසල මට්ටම් කිරීම සඳහා PC 120 ස්කැවේටර් යන්ත්‍රය පැය 20 ක් සේවයේ යොදවා ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 160,000.00 |
| 107 | 121 | Welux Enterprises | Wireman Thumber Switch 10 A 300 ක් මිලදී ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 60,900.00 |
| 108 | K01 | ලංකා බැංකුවේ අංගාගොඩ පිටාරඹ වැඩිහිටි සමිතිය ගි.අ. 72576318 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම ව්‍යාපෘතියේ රැඳවුම් මුදල් ගෙවීම. | 464,596.23 |
| 109 | K02 | ලංකා බැංකුවේ අංගාගොඩ පිටාරඹ ජ්‍යෙෂ්ඨ පුරවැසි සමිතිය ගි.අ. 72576318 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ බිම කොන්ක්‍රීට් කිරීම/කපරාරු කිරීම ව්‍යාපෘතියේ රැඳවුම් මුදල් ගෙවීම. | 142,403.56 |

| | | | | |
|---|---|---|---|---|
| 110 | L01 | මහජන බැංකුවේ ශෂිකලා දර්ශනී මහ ආචාරිගේ ගි.අ. 084-2-001-6-0011781 | ආපදා ණය ලබාදීම. | 135,320.00 |
| 111 | L02 | ලංකා බැංකුවේ ඩී.ඩී.ආර්.එස්. වික්‍රමරත්න ගි.අ. 85644209 | ආපදා ණය ලබාදීම. | 225,290.00 |
| 112 | L03 | ලංකා බැංකුවේ එස්.ජී. ධම්මික ගි.අ. 84859626 | ආපදා ණය ලබාදීම. | 200,000.00 |

01.පිටු අංක 46 සිට 53 දක්වා වූ අංක 01 සිට 112 දක්වා වන වවුචර් පරීක්ෂා කොට අනුමැතිය සඳහා නිර්දේශ කරමු.

02.2025.08.21 දිනැතිව "252-6569 කැබ් රථයේ පවර් ස්ටිරියන් පද්ධතිය අලුත්වැඩියා කිරීම" යන මැයෙන් යුතුව සං/02 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව සභාවට අයත් 252-6569 අංක දරණ කැබ්රථයේ පවර් ස්ටිරියන් පද්ධතියේ හටගත් දෝෂ තත්ත්වය අලුත්වැඩියා කිරීම සඳහා කොග්ගල ඩිපෝ ඉන්ජිනේරුවරයාගේ නිර්දේශ මත ඇස්තමේන්තුවක් ලබාගැනීම සඳහා රථය ඉඳුරුව, අතුරුවැල්ල පිහිටි සසිඳු මෝටර්ස් ආයතනය වෙත යොමු කරන ලද අතර එම ආයතනය විසින් ඉදිරිපත් කර ඇති රු.71,000.00 ක අලුත්වැඩියා මිල ගණන් සාධාරණ බව කොග්ගල ඩිපෝ ඉංජිනේරුවරයා නිර්දේශ කර ඇති බැවින් එම නිර්දේශයට යටත්ව රථයේ දෝෂ තත්ත්වය අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබාදෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව උක්ත සඳහන් කැබ් රථයේ පවර් ස්ටිරියන් පද්ධතිය රු.71,000.00 මිල ගණන් යටතේ සසිඳු මෝටර්ස් ආයතනයෙන් අලුත්වැඩියා කිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

03.2025.08.14 දිනැතිව "ආදාහනාගාරයේ වාර සේවාව සම්බන්ධවයි" යන මැයෙන් යුතුව ආදාහනාගාර ක්‍රියාකරු ඉන්දික හෙට්ටිගොඩ මයා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව ආදාහනාගාරයේ පසුගිය සේවා වාරයෙන් පසු ආදාහන 125 ක් සිදුකර ඇති බැවින් වාර සේවාව සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරදෙන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ආදාහනාගාරයේ වාර සේවාව සිදුකිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

04.2025.09.08 දිනැතිව "සැලසුම් අනුමැතියට අදාළ අයදුම්පත් මුද්‍රණය කර ගැනීම සම්බන්ධවයි" යන මැයෙන් යුතුව සං/01 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව සැලසුම් අනුමැතියට අදාළ පහත සඳහන් අයදුම්පත් මුද්‍රණය කරවා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

- ගොඩනැඟිලි අයදුම්පත් - 500
- ඉඩම් අනුබෙදුම් අයදුම්පත් - 500
- වීථි රේඛා (ගොඩනැඟිලි සීමා නොපවරා ගැනීමේ සහතික) - 500
- මාර්ග පලුදු (ජලය ලබාගැනීම සඳහා) අයදුම්පත් - 500

ඒ අනුව උක්ත සඳහන් අයදුම්පත් ආකෘති මුද්‍රණය කර දීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

05.2025.09.04 දිනැතිව "අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සම්බන්ධවයි" යන මැයෙන් යුතුව අභ්‍යන්තර විගණන නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති 2025 ජුනි මස වවුචර් පරීක්ෂාවට අදාළ අභ්‍යන්තර විගණන වාර්තාව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

06.2025.09.01 දිනැතිව “ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2025” යන මැයෙන් යුතුව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ සම්බන්ධීකරණ ලේකම් විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2025 අදාළව ප්‍රවාහන,මහාමාර්ග,වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය විසින් හා බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් රේඛීය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ග්‍රාමීය මාර්ග තොරතුරු එවා ඇති අතර එහි ඇතුළත් මාර්ග සංවර්ධන ව්‍යාපෘති බෙන්තොට සභාවට අයිති සංවර්ධන ව්‍යාපෘති ලේඛනයට ද ඇතුළත් වී ඇත්දැයි පරීක්ෂාකර එසේ යම් මාර්ගයක් ඇතුළත් වී ඇත්නම් එය ඉවත් කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. ඒ අනුව එම ලිපිය අනුව කටයුතු කිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

07.2025.09.06 දිනැතිව “දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන අංශය - පළාත් පාලන මාර්ග" යන මැයෙන් යුතුව අංක 3/1/1/මාර්ග දරණ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන), පළාත් පාලන දෙපාර්තමේන්තුව (දකුණු පළාත) විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව බෙන්තොට හොරවල තොටුපල හන්දියේ සිට තොටුපල පාර ඉත්තැපාන දක්වා ඇති මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මුළු ප්‍රතිපාදන මුදල වන රු. මි. 5.3 න් මේවන විටත් රු.මි. 3.65 ක ප්‍රතිපාදන අනුමත කර ඇති අතර මෙම ලිපිය මඟින් ඉතිරි මුදල වන රු.මි. 1.65 ක ප්‍රතිපාදන අනුමත කර එවා ඇත. ඒ අනුව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත දැනගැනීම සඳහා ඉදිරිපත් කර ඇති මෙම ලිපිය මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

08.2025.09.08 දිනැතිව “වෙබ් පිටුවට අදාළ සේවා ගිවිසුම” යන මැයෙන් යුතුව සං/05 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මූල්‍ය අනුග්‍රහය යටතේ Media Horizon ආයතනය විසින් අප ආයතනය වෙත නිර්මාණය කර දුන් වෙබ් අඩවියේ නඩත්තු කටයුතු හා සේවා සැපයීමට අදාළව වාර්ෂිකව ගිවිසුමක් ක්‍රියාත්මක අතර 2025.10.01 දින සිට 2026.09.31 දක්වා වන සේවා ගිවිසුම Media Horizon ආයතනය විසින් අප ආයතනය වෙත එවා ඇත. ඒ අනුව Media Horizon ආයතනය සමඟ උක්ත කාරණය සම්බන්ධව ගිවිසුම්ගත වීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

09.2025.09.08 දිනැතිව “RE 9232 ට්‍රැක්ටර් රථයේ බ්‍රේක් පද්ධතිය අලුත්වැඩියා කිරීම” යන මැයෙන් යුතුව සං/02 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව සභාවේ කසල ඇදීමේ රාජකාරි සඳහා යොදවා ඇති RE 9232 අංක දරණ ට්‍රැක්ටර් රථයේ හටගෙන ඇති දෝෂ තත්ත්වයන් අලුත්වැඩියා කිරීම සඳහා කොග්ගල ඩිපෝ ඉංජිනේරුවරයාගේ කාර්මික වාර්තාවන් අනුව Brown & Company PLC ආයතනයෙන් රු. 158,139.38 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති අතර එම ඇස්තමේන්තුවේ ඇතුළත් මිල ගණන් සාධාරණ බව ඩිපෝ ඉංජිනේරුවරයා මිල සාධාරණ වාර්තාව ඉදිරිපත් කර ඇති බැවින් අදාළ මිල ගණන් යටතේ ට්‍රැක්ටර් රථයේ දෝෂ තත්ත්වයන් අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව RE 9232 ට්‍රැක්ටර් රථය රු. 158,139.38 ක මිල ගණන් යටතේ අලුත්වැඩියා කිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

10.2025.06.16 දිනැතිව "ඇඟිලි සලකුණු යන්ත්‍රය ක්‍රියා විරහිත වීම" යන මැයෙන් යුතුව ඉඳුරුව කාර්යභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ඉඳුරුව උප කාර්යාලයේ ඇඟිලි සලකුණු යන්ත්‍රය වරින් වර අක්‍රිය වී පැවති අතර 2025.06.16 වන දින නැවත යථා තත්ත්වයට පත් නොවුණු බැවින් නව ඇඟිලි සලකුණු යන්ත්‍රයක් ලබාදීමට කටයුතු කරන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව අවස්ථා කිහිපයකදී මෙම ඇඟිලි සලකුණු යන්ත්‍රය අලුත්වැඩියා කර ඇති අතර එහි තිරය ද අක්‍රිය වෙමින් පවතින බව ඉඳුරුව තාක්ෂණ සේවා නිලධාරි විසින් නිර්දේශ කර ඇති බැවින් නව ඇඟිලි සලකුණු යන්ත්‍රයක් ලබාදීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

11.2025.09.09 දිනැතිව ආ/04 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2025 වර්ෂයේ බෙන්තොට ප්‍රාදේශීය සභාව සඳහා අභිනවයෙන් තේරී පත්වූ ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සමූහ ඡායාරූපයක් ලබා ගැනීමටත් එම ඡායාරූපය සභිකවරු 23 දෙනා වෙත ලබාදීමටත් ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන් සඳහා නිල හැඳුනුම්පත් සකස්කිරීමටත් අවශ්‍ය අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සමූහ ඡායාරූපයක් ලබාගැනීමටත් එම ඡායාරූපය සභිකවරු 23 දෙනා වෙත ලබාදීමටත් ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන් සඳහා නිල හැඳුනුම්පත් සකස් කිරීමටත් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

12.2025.09.08 දිනැතිව "LD 8614 රථය සේවා කිරීම හා බ්‍රේක් අලුත්වැඩියා කිරීම" යන මැයෙන් යුතුව සං/02 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව සභාවට අයත් LD 8614 දරණ රථයේ නියමිත වාර සේවාව එළඹ ඇති බැවින් එම සේවාව සිදුකිරීම සඳහාත් රථයේ තිරිංග අලුත්වැඩියා කිරීම සඳහාත් එහි රියදුරු විසින් ඉල්ලීමක් කර ඇති බව දන්වා ඇත. ඒ අනුව උක්ත සඳහන් LD 8614 රථයේ වාර සේවාව Induruwa Car Care Service ආයතනයෙනුත් රථයේ තිරිංග අලුත්වැඩියා කිරීම සභාවේ ලියාපදිංචි ආයතනයක් මඟින් සිදුකරවා ගැනීමටත් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

13.2025.09.08 දිනැතිව "දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025/ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන/ප්‍රජා ජල අංශය" යන මැයෙන් සං/03 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව බිලූ මවුන්ටන් ළිඳ ආශ්‍රිත ඉඩමේ පොළව හා ගේට්ටුව සකස් කිරීම ව්‍යාපෘතිය සඳහා අනුමත මුදල රු. මිලියන 1.2 ක් වන අතර උක්ත ව්‍යාපෘතිය සිදුකරගෙන යාමේදී දකුණු පළාත් ප්‍රධාන ඉංජිනේරුතුමා විසින් ව්‍යාපෘති පරිශ්‍රය නිරීක්ෂණය කර එහිදී තාක්ෂණ සේවා නිලධාරි වෙත ලබාදුන් උපදෙස් වන,

- කොන්ක්‍රීටයේ උස 6" කිරීම.
- බවුසරය ස්ථානගත කරන ස්ථානයේ වැරගැන්නුම් යෙදීම.
- සිතියමේ පරිදි සෘජුහෝම් යෙදීම.

සඳහා තාක්ෂණ සේවා නිලධාරි විසින් නැවත සකස් කරන ලද රු. 1,325,000.00 වන ඇස්තමේන්තුව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. ඒ අනුව බිලූ මවුන්ටන් ළිඳ ආශ්‍රිත ඉඩමේ පොළව හා ගේට්ටුව සකස් කිරීම ව්‍යාපෘතියට අදාළ නැවත සකස් කරන ලද රු. 1,325,000.00 ක් වූ ඇස්තමේන්තුව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කල අතර දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025 යටතේ අනුමත ප්‍රතිපාදන මුදලට අමතරව වැයවන මුදල සභා අරමුදලින් දැරීමටත් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමැතිය ලබාදෙන ලදී.

14.2025.09.01 දිනැතිව "කොම්පෝස්ට් අංගනය සැකසීම (ගොඩනැඟිල්ල, ආරක්ෂිත වැට, ගේබියන් බැම්ම) Construction of the composting yard (Building, Security fens and Gabian wall)" යන

මැයෙන් සං/03 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව කොම්පෝස්ට් අංගනය සැකසීම (ගොඩනැඟිල්ල, ආරක්ෂිත වැට, ගේබියන් බැම්ම) ව්‍යාපෘතිය සඳහා තාක්ෂණ සේවා නිලධාරි විසින් සකසා දකුණු පළාත් පළාත් පාලන ප්‍රධාන ඉංජිනේරු විසින් අනුමත කරන ලද රු. 7,500,000.00 ක් වූ ඇස්තමේන්තුව ඉදිරි කටයුතු සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව එම ඇස්තමේන්තුව අනුමත කිරීම, එම ප්‍රතිපාදනයන්ට අමතරව මුදලක් වැය වේ නම් එය සභා අරමුදලින් දැරීමට හා සීමිත තරඟකාරී ලංසු කැඳවීම යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

01. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
02. කේ.ඩී.මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
03. රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා - ගරු මන්ත්‍රී
04. නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී
05. ඩී.ඩී.නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
06. බී. සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා - ගරු මන්ත්‍රී

2025.09.09 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(6)(2). 2025.09.11 දිනැති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාවට ඉදිරිපත් කිරීම.**

2025.09.11 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2025/09/11 දින පෙ.ව. 10.00ට බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද ප්‍රසම්පාදන කමිටු රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.

සහභාගීත්වය

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. ලෙනිකා දූශාන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රී
3. උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී
4. පුණ්‍ය ශ්‍රී ලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
5. තාරක විජේකෝන් මැතිතුමා - ගරු මන්ත්‍රී
6. K.D. මිගාර නේමින්ද මැතිතුමා - ගරු මන්ත්‍රී

**01.<u>බෙන්තොට ප්‍රාදේශීය දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම් වැඩසටහනේ ජයග්‍රාහක සිසුන් සඳහා ත්‍යාග ලබාදීම වෙනුවෙන් පිටු 120 CR පොත් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණන් කැඳවූ කාලසීමාව - 2025/09/01 - 2025/09/08
ලිපිගොනු අංකය - බෙප්‍රාස/ගි/05

| ද්‍රව්‍ය/ භාණ්ඩ/ උපකරණ සේවා විස්තරය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන | | |
|---|---|---|---|
| | **Epic International පුද්.සමාගම, No.70, St මිචෙල් පාර, හැඩිගම, පිළියන්දල.** | **ස්ථාන භාර නිලධාරි, රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව, නො.341, මහ වීදිය, අම්බලන්ගොඩ.** | **චාමර බුක්ෂොප්, බස් නැවතුම්පොළ, අම්බලන්ගොඩ.** |
| | ඒකකයක මිල (රු.) | මිල (රු.) | මිල (රු.) |
| පිටු 120 CR පොත් (තනිරූල් ) පොත් 830 | 149/= | 150/50 | 155/= |

සභාවේ ලියාපදිංචි වී ඇති ආයතන සහ ආසන්න ස්ථාන වෙතින් මිල ගණන් ලිපි ඉදිරිපත් කර තිබූ අතර,අදාල මිල ගණන් සමඟ පොත් සාම්පල පරීක්ෂා කරන ලද ප්‍රසම්පාදන කමිටුව ඒ සඳහා එක් පොතක් වෙනුවෙන් අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ පිළියන්දල, හැඩිගම, ශාන්ත මිචෙලි පාර, නො.70/D පිහිටි Epic International (පුද්.) සමාගම වෙතින් එක් පොතක් රු.149/= බැගින් පොත් 830ක් රු.123,670/= මුදලකට මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**02**.**<u>බෙන්තොට ප්‍රාදේශීය සභාව මගින් ගැබිණි මව්වරු 150ක් වෙනුවෙන් සංවිධානය කරනු ලබන දැනුවත් කිරීමේ හා සංගීත වැඩසටහන වෙනුවෙන් ශබ්ද විකාශන පහසුකම් ලබාගැනීම සඳහා මිල ගණන් කැඳවීම</u>**

මිල ගණන් කැඳවූ කාලසීමාව - 2025/09/01 - 2025/09/08
ලිපිගොනු අංකය - බෙප්‍රාස/ගි/05

| ද්‍රව්‍ය/ භාණ්ඩ/ උපකරණ සේවා විස්තරය | අවශ්‍ය ප්‍රමාණය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන පිළිබඳ විස්තර | | |
|---|---|---|---|---|
| | | මිල (රු.) | මිල (රු.) | මිල (රු.) |
| | | Shamen Electronic – 42 Yalagama Induruwa | Nishantha Sounds Haburugala | N.S. Sounds Elakaka Haburugala |
| FM මයික් | 03 | 12,000/= | 11,000/= | 10,000/= |
| Notification Stand | 03 | 2,000/= | 3,000/= | 5,000/= |

| | | | | |
|---|---|---|---|---|
| බෆල් (AMP/mixer with) Full Set | 04 | 10,000/= | 15,000/= | 13,000/= |
| මුළු එකතුව (ප්‍රවාහනය සමඟ) | | 24,000/= | 29,000/= | 28,000/= |

ප්‍රදේශයේ ආසන්න ස්ථාන 03ක් වෙතින් මිල ගණන් ලිපි ඉදිරිපත් කර තිබුනි. මිල ගණන් සලකා බැලූ කමිටුව අදාල අයිතමයන් සියල්ල වෙනුවෙන් අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ඉඳුරුව,යාලේගම, Shamen Electronics වෙතින් රු.24,000/=ක මුදලකට එම සේවාව ලබාගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**03.<u>කොම්පෝස්ට් අංගනය සෑදීම ( ගොඩනැගිල්ල/ ආරක්ෂිත වැට/ ගේබියන් බැම්ම) ව්‍යාපෘතියේ ලංසුපත ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කිරීම</u>**

උක්ත ව්‍යාපෘතිය සීමිත පදනම යටතේ ටෙන්ඩර් කැඳවා සිදු කිරීම සඳහා 2025.09.09 වන දින පැවති බෙන්තොට ප්‍රාදේශීය සභා මුදල් කමිටුවේදී නිර්දේශ වූ අතර ඊට අදාළව සකස් කරන ලද ලංසුපත පිළිගැනීම සුදුසු බවට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි. ඒ අනුව කොම්පෝස්ට් අංගනය සෑදීම (ගොඩනැගිල්ල/ ආරක්ෂිත වැට/ ගේබියන් බැම්ම) ව්‍යාපෘතියේ ලංසු ඇගයීම් කමිටුව පත් කිරීම

**එහිදි උක්ත ව්‍යාපෘතියේ ලංසු ඇගයීම් කමිටුව ලෙස පහත නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම සුදුසු බවට ප්‍රසම්පාදන කමිටුව තීරණය කරන ලදි.**

- පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ ප්‍රධාන ඉංජිනේරු O.C.ජයනන්දන මයා (සභාපති)
- පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ සැලසුම් ශිල්පී රවීන්ද්‍රා ගුණසේකර මෙනෙවිය (සාමාජික)
- පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ ඉංජිනේරු සහකාර W.තුෂාණි මිය (සාමාජික)
- බෙන්තොට ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ සේවා නිලධාරි D.D. සතාරා නදීශානි මිය (සාමාජික)
- බෙන්තොට ප්‍රාදේශීය සභාවේ සංවර්ධන නිලධාරි K.A.ප්‍රභා මධුශානි මෙනෙවිය (සාමාජික)

**කොම්පෝස්ට් අංගනය සෑදීම( ගොඩනැගිල්ල/ ආරක්ෂිත වැට/ ගේබියන් බැම්ම) ව්‍යාපෘතිය සීමිත ජාතික තරඟකාරි ලංසු කැඳවීම මඟින් සිදු කිරීමට අදාලව කොන්ත්‍රාත් ආයතන තෝරාගැනීම**

බෙන්තොට ප්‍රාදේශීය සභාව වෙත 2025 වර්ෂය සඳහා Irrigation & Drainage අංශය යටතේ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කරගෙන නොමැති බැවින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි ගාල්ල දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත්කරුවන් අතරින් පහත ව්‍යාපෘතියේ වටිනාකමට අදාළ ශ්‍රේණිය සපුරා ඇති (C8 or above) බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොන්ත්‍රාත්කරුවන් ද ඇතුලුව යාබද බලපිටිය, කරන්දෙණිය හා ඇල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල කොන්ත්‍රාත්කරුවන් අතරින් මුල්ම

කොන්ත්‍රාත්කරුවන් 15 දෙනා වන පහත කොන්ත්‍රාත්කරුවන් වෙත ලංසු යොමු කිරීම සුදුසු බවට ප්‍රසම්පාදන කමිටුව තීරණය කරන ලදී.

I. S N J K CONSTRUCTION – 49/40, Ananda Vidyala Mawatha, Elpitiya – C7
II. P M C BUILDERS – Mahawatta, Pelawatta Road, Pitigala– C7
III. SAKURA CONSTRUCTION – 66/1A, Asiri Uyana, Mahinda Mawatha, Elpitiya – C7
IV. H S K BUILDERS - Amila, Ihalagoda, Amugoda– C7
V. S R V K CONSTRUCTION - 300, Siththaragoda, Amugoda– C7
VI. DEVEE CONSTRUCTION – 322, Idhipalegoda, Pitigala – C7
VII. DEVRAM CONSTRUCTION – 179, Kommala, Bentota– C7
VIII. P J CONSTRUCTION – Darshana, Uhanowita, Pitigala– C7
IX. BUDDHI ATHUKORALA CONSTRUCTION – Pelawaththa RD, Pitigala– C7
X. D W CONSTRUCTION, Araliya Place, Aluthgama RD, Elpitiya– C7
XI. RANTHARU ELECTRICIAN AND CONTRACTORS, Polgaswaththa, Pituwala,Elpitiya – C7
XII. GAMAGE CONTRACTORS - 9/15, Jaya MW – Pituwala RD, Elpitiya - C7
XIII. THAMALI BUILDERS – Jaya Sri, Thotupola RD, Pitigala - C7
XIV. MESADU CONSTRUCTION – Premaraja Kumarasinghe Mawatha, Haburugala, Bentota - C7
XV. PRIYANTHA ENTERPRISES – Galthuduwa, Gonagalapura - C7

**04**. **බෙන්තොට හොරවල තොටුපළ හන්දියේ සිට ඉත්තෑපාන දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ ලංසුපත් භාර ගැනීමේ කාලය දීර්ඝ කිරීම**

බෙන්තොට හොරවල තොටුපළ හන්දියේ සිට ඉත්තෑපාන තොටුපළ දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ ලංසුපත් භාර ගැනීමේ අවසාන දිනය 2025.09.24 දින ප.ව.2.00 හා ලංසුපත් විවෘත කිරීම එදින එම වේලාවටම ලෙස තීරණය කර තිබුණ ද නොවැළැක්විය හැකි හේතුවක් මත ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන්හට එදින සහභාගී වීමට නොහැකි බැවින් ලංසුපත් භාර ගැනීමේ අවසාන දිනය 2025.10.01 දින ප.ව.1.00 දක්වා දීර්ඝ කිරීමටත් එදින එදින එම වේලාවටම බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන ලංසුපත් විවෘත කිරීම සිදු කිරීමට සුදුසු බවට ප්‍රසම්පාදන කමිටුව තීරණය කරන ලදී.

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. ලෙනිකා දුශාන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රී
3. උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී
4. පුණ්‍ය ශ්‍රී ලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
5. තාරක විජේකෝන් මැතිතුමා - ගරු මන්ත්‍රී
6. K.D. මිගාර නේමින්ද මැතිතුමා - ගරු මන්ත්‍රී

2025.09.11 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමාගේ ස්ථීරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**(6)(3). 2025.09.23 දිනැති කාර්මික හා සේවා කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාවට ඉදිරිපත් කිරීම.**

2025.09.23 දින පැවති කාර්මික හා සේවා කමිටු වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**<u>2025.09.23 දින පෙ.ව. 9.00ට බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල රැස්වීම් ශාලාවේදී පැවති කාර්මික හා සේවා කමිටුව.</u>**

සහභාගීත්වය

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා - ගරු මන්ත්‍රී
3. නිහාල් මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී
4. නදීශාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
5. තාරක විජේකෝන් මැතිතුමා - ගරු මන්ත්‍රී

**1) 2025.08.19 බෙන්තොට ප්‍රාදේශීය මහ සභා දින සිට මෙතෙක් සභාවන්හී දී සම්මත මාර්ග/ ගොඩනැගිලි/ ඉඩම් සංවර්ධන යෝජනා අතරින් ප්‍රමුඛතාවය ලබා දිය යුතු යෝජනා සාකච්ඡා කිරීම.**

2025.08.19 බෙන්තොට ප්‍රාදේශීය සභාවේ මහ සභා දින සිට මෙතෙක් සභාවන්හීදී සම්මත වී ඇති මාර්ග/ ගොඩනැගිලි/ඉඩම් සංවර්ධන යෝජනා අතරින් ප්‍රමුඛතාවය ලබාදිය යුතු යෝජනා සම්බන්ධව තීරණයක් ගැනීම සඳහා එම යෝජනා කාර්මික හා සේවා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි.

එහිදී පවතින ප්‍රතිපාදන තත්ත්වය හා යෝජනා පිළිබඳ සාකච්ඡා කරනු ලදුව සභාව මඟින් දෛනික රාජකාරි ලෙස සිදු කරනු ලබන සභාව සතු බැකෝ යන්ත්‍රය යොදවා සිදු කළහැකි කාණු පිරිසිදු කිරීම් සම්බන්ධ යෝජනා, සිලින්ඩර්/ හියුම් පයිප්ප/ කොන්ක්‍රීට් ලැලි යෙදීම් සම්බන්ධ වූ යෝජනා, පොදු ළිං හා සුසාන භූමි සුද්ද පවිත්‍ර කිරීම හා සම්බන්ධ වූ යෝජනා හා Premix යොදා සංවර්ධනය සිදු කළ හැකි සුළු අළුත්වැඩියාවන් සහිත වූ යෝජනා හා පහත සඳහන් ව්‍යාපෘති යෝජනා පළමුවෙන් සිදු කිරීමටත්, කොන්ක්‍රීට් හෝ තාර යොදා සංවර්ධනය කළ යුතු මාර්ග හා සම්බන්ධ යෝජනා ප්‍රතිපාදන තත්ත්වය හා ප්‍රමුඛතාවය මත සලකා බලා ඉදිරියේ දී සිදු කිරීමටත්, සභාවේ වපසරියට අයත් නොවන යෝජනා අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බවටත් කාර්මික හා සේවා කමිටුව නිර්දේශ කරන ලදි.

I. 2025.08.19 දින මහ සභාවේ දී ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා අනුව තීරණ අංක (ඉ)(1)(3), බෙන්තොට පාලම අසල නාගරික සංවර්ධන අධිකාරියෙන් අප හට පවරා ඇති භූමියේ හෙළ බොජුන් හල/ රමණීය වෙළඳසැල පවත්වාගෙන යාම සුදුසු බව.

II. 2025.08.19 දින මහ සභාවේ දී ගරු මන්ත්‍රී ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද තීරණ අංක (ඉ)(8)(1), බෙන්තොට යාත්‍රාමුල්ල කොට්ඨාසයේ

පහුරුමුල්ල වසමේ ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩාංගනයට (බලිවල ක්‍රීඩාංගනය) ඇඩි අවශ්‍යතාවයක් වන විදුලිය ලබාදීමේ යෝජනාව සම්බන්ධයෙන් ක්‍රීඩා භූමිය විවිධ සන්දර්ශන හා සංගීත ප්‍රදර්ශන සඳහා ද ලබාදෙන බැවින් ක්‍රීඩාංගනය සඳහා තෙකලා විදුලිය ලබා ගැනීම සුදුසු බව

**2) රන්තොටුවිල ආචාරියවත්ත වටරවුම් මාර්ගය තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීම - ප්‍රතිපාදන මුදල ඇතුළත Civil Cost එකට අමතර අවිනිශ්චිත මුදල ලබාගැනීමට වූ ඉල්ලීම.**

දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025 යටතේ රන්තොටුවිල ආචාරියවත්ත වටරවුම් මාර්ගය තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගිවිසුම්ගත රන්තොටුවිල ප්‍රජා මූල සංවිධානය විසින් ව්‍යාපෘතිය සිදු කරගෙන යාමේ දී නියමිත ප්‍රමාණයට වඩා පාර දිගින් වැඩිපුර හා දෙවැනි වර තාර දැමීමේ දී පාර දෙපැත්ත සම්බන්ධ වන ආකාරයෙන් එක පාරක් ලෙස එකලස් කිරීම ද සිදු කරමින් නිසියාකාරව සිදු කිරීම නිසා ඇස්තමේන්තු මුදලෙහි පවතින අමතර මුදල් ඉල්ලමින් යොමු කර ඇති ලිපිය ඉදිරි කටයුතු සඳහා කාර්මික හා සේවා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි.

ව්‍යාපෘතිය සඳහා අනුමත ප්‍රතිපාදන ප්‍රමාණය රු.900,000.00ක් වන අතර ඇස්තමේන්තුගත Civil Cost අගය රු.820,323.68කි. ඇස්තමේන්තුගත ප්‍රමාණය ඉක්මවා කරන ලද වැඩවල වටිනාකම වන රු.148,531.44ක මුදල සමඟ බිල්පත් මුදල රු.968,855.12ක් වන අතර තාක්ෂණ සේවා නිලධාරි වාර්තාවන් ද සැලකිල්ලට ගත් කර්මාන්ත හා සේවා කමිටුව දකුණු පළාත් පාලන කාර්යාල නිර්දේශයට යටත්ව අනුමත ප්‍රතිපාදන ප්‍රමාණය වන රු.900,000.00ක මුදල පමණක් ගෙවීම් කිරීම සුදුසු බවට නිර්දේශ කරන ලදි.

**3) කොබෙයිදුව පෙර පාසලේ රැඳවුම් බිත්තිය සමඟ ආරක්ෂිත වැට ඉදිකිරීමේ ව්‍යාපෘතිය - සංශෝධිත ව්‍යාපෘතිය වන ආරක්ෂිත තාප්පය ඉදි කිරීමේ ව්‍යාපෘතිය ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම.**

දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, වෙනත් සේවා අංශය යටතේ ප්‍රතිපාදන අනුමත කොබෙයිදුව පෙර පාසලේ රැඳවුම් බිත්තිය සමඟ ආරක්ෂිත වැට ඉදිකිරීම ව්‍යාපෘතිය 2025.09.16 මහා සභා (ඊ)(1)(9) තීරණය යටතේ ආරක්ෂිත වැට වෙනුවට ආරක්ෂිත තාප්පයක් ඉදි කිරීම ලෙස සංශෝධනයට තීරණය කර ඇති බැවින් සංශෝධිත ව්‍යාපෘතිය සඳහා තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලද රු. 2,000,000.00ක් වූ ඇස්තමේන්තුව ඉදිරි කටයුතු සිදු කිරීමට කාර්මික හා සේවා කමිටුවට ඉදිරිපත් කරන ලදි.

ඒ අනුව රැඳවුම් බිත්තිය සමඟ ආරක්ෂිත වැට ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා අනුමත ප්‍රතිපාදන වන රු.මි.2.00 තුළම ආරක්ෂිත තාප්පය ඉදි කිරීමේ ව්‍යාපෘතිය සිදු කළහැකි බැවින් හා කල්පැවැත්ම හා ආරක්ෂාව ඉහල බැවින් තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලද රු. 2,000,000.00ක් වූ ඇස්තමේන්තුව පිළිගැනීමටත්, ඒ අනුව ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කිරීමටත් අනුමත ප්‍රතිපාදනයන්ට වඩා යම් මුදලක් වැය වේ නම් එය සභා අරමුදල මගින් දැරීමට සුදුසු බවටත් කර්මාන්ත හා සේවා කමිටුව නිර්දේශ කරන ලදි.

**4) බෙන්තොට පොලිස් ස්ථානය ඉදිරිපිට භූමියේ ඇති වතුර වලවල් පිළිසකර කිරීම සම්බන්ධව**

බෙන්තොට පොලිස් ස්ථානය ඉදිරිපිට රථවාහන ගාල් කිරීම සඳහා භාවිතා කරනු ලබන භූමියේ ස්ථාන කිහිපයක් ගිලා බැසීම නිසා වලවල් සෑදී වැසි කාලවලදී ජලය පිරීමෙන් අනාරක්ෂිතභාවයක් ඇති වන

බැවින් එම වලවල් තාර යොදා පිළිසකර කර දෙන මෙන් ඉල්ලමින් 2025.07.12 දිනැති බෙන්තොට පොලිස් ස්ථානාධිපති විසින් යොමු කර ඇති ලිපිය ඉදිරි කටයුතු සඳහා කාර්මික හා සේවා කමිටුවට ඉදිරිපත් කරන ලදි.

ඒ අනුව එම භූමිය ප්‍රාදේශීය සභාවට අයත් නොවන බැවින් ප්‍රතිපාදන වෙන් කිරීමට හැකියාවක් නොමැති බවත් භූමිය පවරා ගැනීමට හැකි නම් එම ප්‍රතිසංස්කරණයන් සිදු කිරීමට හැකි බවටත් කර්මාන්ත හා සේවා කමිටුව නිර්දේශ කරන ලදි.

## 5) කයිකාවල - දිගන්අද්දර පාර සම්බන්ධව

කයිකාවල - දිගන්අද්දර පාර මේ වන විට ඇතැම් ස්ථානවල කොන්ක්‍රීට් කළ තැන් කැඩී ගොස් පාර දෙපස කාණු පද්ධති ද වැසී ගොස් ඇති බැවින් මේ සම්බන්ධයෙන් අදාළ පියවර ගන්නා ලෙස ඉල්ලමින් 2025.08.25 දිනැතිව යොමු කර ඇති නිර්ණාමික ලිපිය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කාර්මික හා සේවා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි.

ඒ අනුව ඉදිරියේ දී පවතින ප්‍රතිපාදන හා ප්‍රමුඛතාවය අනුව මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සලකා බැලීම සුදුසු බවට කාර්මික හා සේවා කමිටුව නිර්දේශ කරන ලදි.

## 6) අංගාගොඩවත්ත පාර අලුත්වැඩියා කිරීම

අංගාගොඩවත්ත පාර පසුගිය කාලයේදී ජල නළ එලීම සඳහා පලුදු කිරීම හා අධික වර්ෂාවට සේදී යාමෙන් මාර්ගය දෙපස නිවෙස්වල පදිංචිකරුවන්, පාසල් ළමුන් ඇතුලු මාර්ගය භාවිතා කරන සියලු දෙනා අපහසුතාවයට පත්ව ඇති බැවින් මාර්ගය පිළිසකර කර දෙන ලෙස ඉල්ලමින් බෙන්තොට, අංගාගොඩ ලිපිනයෙහි පදිංචි ජගත් ලක්ෂ්මන් අල්විස් මයා විසින් යොමු කර ඇති ලිපිය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කාර්මික හා සේවා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි.

තාක්ෂණ සේවා නිලධාරි වාර්තාවන් ද සැලකිල්ලට ගත් කාර්මික හා සේවා කමිටුව ප්‍රදේශයේ ජනතාවගේ ගමනාගමන පහසුව සලකා ඉදිරියේ දී පවතින ප්‍රතිපාදන හා ප්‍රමුඛතාවය අනුව සලකා බලා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට නිර්දේශ කරන ලදි.

## 7) බෙන්තොට පාසල්තොට පාර දෙපැත්ත සුද්ද කර ගැනීම සඳහා

බෙන්තොට ප්‍රාදේශීය සභාවට අයත් යාත්‍රාමුල්ල පාසල්තොට පාර දෙපැත්ත සුද්ද කර දෙන ලෙස ඉල්ලමින් බෙන්තොට, යාත්‍රාමුල්ල ලිපිනයෙහි පදිංචි W.A.K විජේසූරිය මයා විසින් 2025.08.07 දිනැතිව යොමු කර ඇති ලිපිය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කාර්මික හා සේවා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි.

ඒ අනුව සභාවේ සේවකයන් යොදවා මාර්ගය දෙපස පවිත්‍ර කර දීම සුදුසු බවට කාර්මික හා සේවා කමිටුව නිර්දේශ කරන ලදි.

## 8) මාර්ගය දෙපස කාණු පද්ධතිය සකස් කර දෙන ලෙස ඉල්ලීම - දෙල්කබලගොඩ, මහ ඌරගහ

මාර්ගය දෙපස කාණු පද්ධතිය නොමැති වීම නිසා මාර්ගයේ ගලා බසින සියලු ජලය තමාගේ ඉඩමට ගලා විත් නතර වී ගැටලුකාරී තත්ත්වයන් ඇති කරන බැවින් පාර දෙපස හා හරස් මාර්ගය හරහා නිවැරදිව කාණු පද්ධතිය සකසා දෙන ලෙස ඉල්ලමින් ඌරගහ, මහ ඌරගහ, දෙල්කබලගොඩ පදිංචි ඕ.කේ.ඩී. ඥානවතී මිය විසින් 2025.03.03 දිනැති ව යොමු කර ඇති ලිපිය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කාර්මික හා සේවා කමිටුවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව මාර්ගය දෙපස හා හරස් මාර්ගයේ කාණු සකස් කර දීම සුදුසු බවට කාර්මික හා සේවා කමිටුව නිර්දේශ කරන ලදී.

### 9) පහළ කඬේ ප්‍රධාන මාර්ගයේ අබලන් කොටස සංවර්ධනය කර ගැනීම සඳහා වන ඉල්ලීම සම්බන්ධවයි

අංක 40 මහ ඌරගහ ග්‍රාම නිලධාරී වසමේ පදිංචි එච්.ජී. කුසුමාවතී යන අය හා ගම්වාසීන් විසින් පහළ කඬේ ප්‍රධාන මාර්ගයේ එම්.ඒ. ධනපාල යන අයගේ නිවස අසලින් ඉහළට මීටර් 200ක් පමණ දුරට දැඩි සේ සෝදා පාලුවට ලක්ව ඇති බැවින් එය පිළිසකර කර දෙන මෙන් ලිපියක් බෙන්තොට ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයට යොමු කරනු ලදුව එකී මාර්ගය ප්‍රාදේශීය සභාවට අයත් වන මාර්ගයක් වන බැවින් අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට 2025.07.04 දිනැතිව බෙන්තොට ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය විසින් යොමු කර ඇති ලිපිය ඉදිරි කටයුතු සිදු කිරීමට කාර්මික හා සේවා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

තාක්ෂණ සේවා නිලධාරී වාර්තාවන් ද සැලකිල්ලට ගත් කාර්මික හා සේවා කමිටුව ප්‍රතිපාදන තත්ත්වය අනුව මාර්ගය ඉදිරියේ දී සකස් කිරීම සුදුසු බවට නිර්දේශ කරන ලදී.

### 10) රජසිරි උයන පටුමඟ පාර නිසි පරිදි සකසා ගැනීම සම්බන්ධව

කටුවත්ත, රජසිරි උයන නිවාස සඳහා පිවිසීමට තිබෙන ඇල්පිටිය පාරේ සිට කටුවත්ත රජසිරි උයන පටුමඟ අඩි 20ක් පළල නමුත් මේ වන විට පදිංචිකරුවන් කිහිපදෙනෙකු විසින් අනීතිකව කාණු කැපීම, පාර කපා තාප්ප බැඳීම හා පාරෙන් ඉඩ අල්ලා නිවාස ඉදි කිරීමට සූදානම් වීම යනා දී කරුණු මත මාර්ගයේ පළල අඩු වී ඇති බැවින් නැවත අඩි 20ක පළලින් යුතුව මාර්ගය සකස් කර දෙන මෙන් ඉල්ලමින් රජසිරි උයන පදිංචිකරුවන් විසින් 2025.08.21 දිනැතිව යොමු කර ඇති ලිපිය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කාර්මික හා සේවා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව මෙම මාර්ගය කැබලි කරන ලද ඉඩමකට අයත් ද යන්න හා පිඹුරුපත් පරීක්ෂාව මඟින් මාර්ගයේ දිග හා පළල තහවුරු කර ගැනීමෙන් අනතුරුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවට කාර්මික හා සේවා කමිටුව නිර්දේශ කරන ලදී.

### 11) නිවෙස්වලට තිබෙන ප්‍රවේශ මාර්ගය අලුත්වැඩියා කර දෙන මෙන් වූ ඉල්ලීම

අංක 10 බී, අකාඩේගොඩ ග්‍රාම සේවා වසමේ අකාඩේගොඩ, මැදගොඩවත්ත නැමැති ඉඩමේ නිවාස 07ක පමණ පදිංචිකරුවන් භාවිතයට ගන්නා මාර්ගය ඉතාම අබලන් තත්ත්වයේ පවතින බැවින් එය ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ඉල්ලමින් පදිංචිකරුවන් විසින් යොමු කර ඇති ලිපිය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කාර්මික හා සේවා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව ඉදිරියේ දී පවතින ප්‍රතිපාදන තත්ත්වය අනුව ප්‍රමුඛතාවය මත සලකා බලා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට කාර්මික හා සේවා කමිටුව නිර්දේශ කරන ලද.

### 12) කුමාරගේ වත්තේ සිට අල්විස් පාර හරහා ඇති කාණුව ප්‍රතිසංස්කරණය කිරීම

දෝපේ කුමාරගේ වත්තේ සිට හොරඩුව ඇළ දක්වා වැටෙන කාණුව ගොඩ වී ජලය බැස යාම මුළුමනින්ම නතර වී ඇති බැවින් ජලය බැස යාම සඳහා ක්‍රමයක් සකස් කර දෙන මෙන් ඉල්ලමින් දෝපේ ග්‍රාම සංවර්ධන සමිති ලේකම් බී.එච්.ඩබ්. ජයතුංග මයා, සභාපති චන්දිම වටවල මයා හා එස්.එච්. නාගොඩවිතාන මයා විසින් යොමු කර ඇති ලිපිය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කාර්මික හා සේවා කමිටුන වෙත ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව එම කාණු පද්ධතිය පවිත්‍ර කර සකස් කර දීම සුදුසු බවට කාර්මික හා සේවා කමිටුව නිර්දේශ කරන ලදී.

**13) පාර දෙපස කාණුව සම්බන්ධව - මද්දෙවෙල ආදාහනාගාර දෙපස කාණුව**

මද්දෙවෙල ආදාහනාගාර පාර දෙපස කාණුව පෙර පැවති තත්ත්වයට වඩා ගොඩ වී පළලින් අඩු වීම නිසා වර්ෂා කාලයේ දී ජලය බැස නොයන බැවින් එය සකසා දෙන මෙන් ඉල්ලමින් බෙන්තොට, මද්දෙවෙල ලිපිනයෙහි පදිංචි එම්.කේ.ඩී. ධනපාල මයා ඇතුලු ප්‍රදේශවාසීන් විසින් 2025.07.10 දිනැති ව යොමු කර ඇති ලිපිය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කාර්මික හා සේවා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව, ප්‍රථම අදියර ලෙස කාණු පද්ධතිය සුද්ද කර දීම සුදුසු බවට කාර්මික හා සේවා කමිටුව නිර්දේශ කරන ලදී.

**14) කාණු පද්ධතිය සහ පාර ප්‍රතිසංස්කරණය කර ගැනීම සඳහා - වඩුමුල්ල සිට කහගල්ල දක්වා කාණු**

හුං/ වඩුමුල්ල ග්‍රාමසේවක වසමේ වඩුමුල්ල මංසන්ධියේ සිට කහගල්ල බෝක්කුව දක්වා රන්දාගොඩ පාර කොටසේ එක් පැත්තක කහගල්ල බෝක්කුව දක්වා කාණු පද්ධතිය සකස් කර ඇති නමුත් කාණු පද්ධතිය සම්පූර්ණ වීම සඳහා මීටර් 600 පමණ කාණු පද්ධතිය සකස් කර නොමැති බැවින් පාරේ වතුර රඳා පවතින බව හා කපුමුල්ල පාරේ (රන්දාගොඩ පටුමඟ) කාණු පද්ධතියක් නොමැති බැවින් වර්ෂා සහිත කාලවලදී පාරේ වතුර රැඳී එහි ගමන් ගන්නා මගීන් අපහසුතාවයට පත්වන බැවින් එම ගැටලු විසඳා ගැනීම සඳහා ප්‍රදේශවාසීන් විසින් 2025.08.05 දිනැතිව යොමු කර ඇති ලිපිය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කාර්මික හා සේවා කමිටුවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව සලකා බැලූ කාර්මික හා සේවා කමිටුව ඉහත කාණු පද්ධති සැකසීම සුදුසු බවත් පවතින ප්‍රතිපාදන තත්ත්වය මත ඉදිරියේ දී මේ සම්බන්ධව සලකා බැලීම සුදුසු බවටත් නිර්දේශ කරන ලදී.

**15) 11 - සී ගලගම - දමංගේවත්ත අතුරුමාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම**

ගලගම දමංගේවත්ත අතුරුමාර්ගයේ කොටසක් ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය මඟින් කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කර ඇති නමුත් මීටර් 50ක පමණ කොටසක් සංවර්ධනය කර නොමැති බැවින් එම මාර්ග කොටස ගිලා බැසීම වැළැක්වීමට රැඳවුම් බැම්මක් ඉදි කර මාර්ගය සකස් කර දෙන මෙන් ඉල්ලමින් ප්‍රදේශවාසීන් විසින් යොමු කර ඇති ලිපිය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කාර්මික හා සේවා කමිටුවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව පවතින ප්‍රතිපාදන හා ප්‍රමුඛතාවය මත සලකා බලා ඉදිරියේ දී මාර්ගය සකස් කර දීම සුදුසු බවට කාර්මික හා සේවා කමිටුව නිර්දේශ කරන ලදී.

**16) බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලේ බිම් මහළ ඇතුලු ඉතිරි වැඩ නිම කිරීම**

බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහළ හා ඉතිරි අලුත්වැඩියාවන් වෙනුවෙන් තාක්‍ෂණ සේවා නිලධාරී විසින් අදියර 02කින් යුතුව සකස් කරන ලද ඇස්තමේන්තු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා කාර්මික හා සේවා කමිටුවට ඉදිරිපත් කරල ලදී.

දැනට කාර්යාලය පවත්වාගෙන යනු ලබන ප්‍රාදේශීය සභා පැරණි කාර්යාලයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන බැවින් නිලධාරීන්/ සේවකයන් අපහසුතාවයට පත්වීම වැළැක්වීමට හා බෙන්තොට මංසන්ධිය වෙත කාර්යාලය ගෙන යාමෙන් මහජනතාවට වඩාත් පහසු සේවාවක් ලබා දීය හැකි බැවින්( රජයේ ආයතනයක්

වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ද යාබද ව පවතින නිසා) කඩිනමින් ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහළ හා ඉතිරි අලුත්වැඩියාවන් සිදු කිරීමටත් තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද පහත ඇස්තමේන්තු පිළිගැනීම සුදුසු බවටත් කාර්මික හා සේවා කමිටුව නිර්දේශ කරන ලදී.

I. Proposed improvement of ground floor office building work at Bentota pradeshiaya sabha building (stage 1) - Rs.2,000,000.00

II. Proposed improvement of ground floor office building work at Bentota pradeshiaya sabha building (stage 2) - Rs.2,000,000.00

**17) ප්‍රධාන මාර්ගයේ බෝක්කුවක් පිළිසකර කර ගැනීම සඳහා - ඇටවලවත්ත**

ඇටවලවත්ත නැගෙනහිර ප්‍රධාන මාර්ගයේ ඇති 4 වන පටුමග අසල ඇති බෝක්කුවෙන් වර්ෂා කාලයේ දී පිටවන ජලය තමාගේ නිවස සහ ඉඩම මැදින් ගලා බසින බැවින් නිවැසියන් හට ගැටලුකාරී තත්ත්වයන් ඇති වන බැවින් මාර්ගය අලුත්වැඩියා කිරීමේ දී මෙම තත්ත්වය මඟ හරවා දෙන මෙන් ඉල්ලමින් ඉඳුරුව, ඇටවලවත්ත(නැ), 478/බී, හි පදිංචි එච්.වී.ධම්මිකා කුමාරි මිය විසින් 2025.08.26 දිනැතිව යොමු කර ඇති ලිපිය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කාර්මික හා සේවා කමිටුවට ඉදිරිපත් කරන ලදී.

තාක්ෂණ සේවා නිලධාරී වාර්තාවන්ට අනුව මෙම මාර්ගය, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධනය කරමින් පවතින බැවින් ඉන් පසුවත් මෙම ගැටලුව පැන නැගුනහොත් ඉදිරියේ දී ගැටලුකාරී තත්ත්වය මඟ හරවාලීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවට කාර්මික හා සේවා කමිටුව නිර්දේශ කරන ලදී.

**18) නිවාස 08කට ගමන් ගන්නා මාර්ගය පිළිසකර කර ගැනීම සම්බන්ධව - මහ ඉඳුරුව, ජෝර්සිගොඩ**

මහ ඉඳුරුව, ජෝර්සිගොඩ මහ ආරච්චි මහතාගේ නිවස ඉදිරිපසින් ඇති මීටර් 100 පමණ දුරක් සහිත නිවාස 08ක පදිංචිකරුවන් ගමන් ගන්නා මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ඉල්ලමින් මහ ඉඳුරුව, ජෝර්සිගොඩ, 20 බී ලිපිනයෙහි පදිංචි ටී.ජී. දයානන්ද මයා ඇතුලු පදිංචිකරුවන් විසින් යොමු කර ඇති ලිපිය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කාර්මික හා සේවා කමිටුවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව පවතින ප්‍රතිපාදන තත්ත්වය හා ප්‍රමුඛතාවය අනුව සලකා බලා ඉදිරියේ දී මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට කාර්මික හා සේවා කමිටුව නිර්දේශ කරන ලදී.

**19) බෙන්තොට - දැල්කඩවේල්ල පිළිසකර කර ගැනීම සම්බන්ධව**

අප ආයතනයට ද අවශ්‍ය කටයුතු සඳහා පිටපත් සහිතව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිශාන්ත පෙරේරා මැතිතුමා වෙත යොමු කර ඇති බෙන්තොට - දැල්කඩ වේල්ල පිළිසකර කර ගැනීම සම්බන්ධව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ සම්බන්ධීකරණ ලේකම්ගේ අංක GPSO/08 හා 2025.08.14 දිනැති ලිපිය හා මේ සම්බන්ධව මීට පෙර ලැබී ඇති ලිපි ඉදිරි කටයුතු සඳහා කාර්මික හා සේවා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව මීට පෙර ඌරගහ, කුඩා ඌරගහ, දැල්කඩ පදිංචි එම්. ගුණසිරි ද සිල්වා මහතා විසින් දැල්කඩ වේල්ල පස් දමා ගොඩකර පිළිසකර කර ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා ගැනීම යන මැයෙන් 2024.11.05 දිනැතිව අප සභාව වෙත කරන ලද ඉල්ලීමකට අනුව ප්‍රදේශවාසීන්ගේ ද සහයෝගය ඇතිව මාර්ගය සංවර්ධනය සඳහා සහයෝගය ලබා දී ඇති බැවින් හා ඉදිරියේ දී පවතින ප්‍රතිපාදන අනුව සලකා බලා මාර්ගය තාර දමා ප්‍රතිසංස්කරණය කිරීමට තීරණය කරනු ලදුව ඒ සඳහා ද එකඟ නොවී එම මහතා

විසින් ම පැති බැමි යෙදීමට ඉල්ලීම් කරනු ලදුව පැති බැමි යෙදීමට විශාල මුදලක් වැය වන බැවින් ප්‍රතිපාදන ලබා දෙන්නේ නම් පැති බැමි යොදා මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට කාර්මික හා සේවා කමිටුව නිර්දේශ කරන ලදී.

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා - ගරු මන්ත්‍රී
3. නිහාල් මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී
4. නදීශාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
5. තාරක විජේකෝන් මැතිතුමා - ගරු මන්ත්‍රී

2025.09.23 දින පැවති කාර්මික හා සේවා කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී නදීශාන් වික්‍රමරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(6)(4). 2025.09.23 දිනැති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාවට ඉදිරිපත් කිරීම.**

2025.09.23 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**2025.09.23 දින පෙ.ව.10.00 ට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සංක්ෂිප්ත වාර්තාවයි.**

සහභාගීත්වය -

7. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
8. කේ.ඩී.මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
9. රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා - ගරු මන්ත්‍රී
10. නිහාල් ගාමිණි මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී
11. ඩී.ඩී.නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී

**ගෙවීම් අනුමත කිරීම.**

පහත සඳහන් ගෙවීම් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | ගෙවන මුදල රුපියල් |
|---|---|---|---|---|
| 01 | 126 | මුදල් භාරකරු<br>ඩී.වී. තරංගි | ගැබිණි මව්වරුන් සඳහා පවත්වන වැඩසටහනේ සංග්‍රහ ඇතුළු සංවිධාන කටයුතු වෙනුවෙන් අත්තිකාරම් ලබා ගැනීම. | 70,000.00 |
| 02 | 127 | බී.සී. නිලන්ති | ගැබිණි මව්වරුන් සඳහා වන සංගීත චිකිත්සක වැඩසටහනේ සංගීත කණ්ඩායම වෙත ගෙවීම් කිරීම. | 30,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 03 | 128 | Local Loans and Development Fund | බෙන්තොට පොදු වෙළඳපල සහිත දෙමහල් ගොඩනැඟිල්ල ඉදිකිරීම් ණය මුදලෙහි 2025 සැප්තැම්බර් මස වාරිකය හා පොළිය ස්ථාවර නියෝගයකින් ගෙවීම. | 229,408.36 |
| 04 | 129 | Local Loans and Development Fund | ගෝනගල පොදු වෙළඳපල සහිත දෙමහල් ගොඩනැඟිල්ල ඉදිකිරීම් ණය මුදලෙහි 2025 සැප්තැම්බර් මස වාරිකය හා පොළිය ගෙවීම. | 368,742.57 |
| 05 | 130 | Serandib Motors | 252-6569 කැබ්රථයේ ඕල්ටනේටරය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 23,950.00 |
| 06 | 131 | ලංකා විදුලිබල මණ්ඩලය | ගෝනගල මහජන පුස්තකාලයේ විදුලි බිල පියවීම.<br>2025.07.14 – 2025.08.14,<br>2025.08.14 – 2025.09.14 | 1,743.58 |
| 07 | 132 | ලංකා විදුලිබල මණ්ඩලය | ආදාහනාගාරයේ, අංගාගොඩ පෙර පාසලේ විදුලි බිල පියවීම. 2025.08.10 – 2025.09.10,<br>2025.08.05 – 2025.09.06 | 2,948.72 |
| 08 | 133 | ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී | හබුරුගල උප කාර්යාලයේ දුරකතන බිල පියවීම.<br>2025.08.01 – 2025.08.31 | 2,769.31 |
| 09 | 134 | ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී | 034-2275419 දුරකතනයේ බිල හා 034-2290646<br>දුරකතනයේ ෆැක්ස් බිල ගෙවීම.<br>2025.08.01 – 2025.08.31 | 15,385.74 |
| 10 | 135 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | බෙන්තොට මහජන පුස්තකාලයේ, දෝපේ පෙර පාසලේ, අංගාගොඩ පෙර පාසලේ ජල බිල පියවීම.<br>2025.08.16 – 2025.09.15,<br>2025.08.13 – 2025.09.12,<br>2025.08.15 – 2025.09.15 | 3,789.25 |

<table>
<tr><td>11</td><td>136</td><td>ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී</td><td>ඉදුරුව උප කාර්යාලයේ දුරකතන බිල පියවීම.<br>2025.08.01 – 2025.08.31</td><td>2,769.31</td></tr>
<tr><td>12</td><td>137</td><td>සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය, බේරුවල</td><td>ඉන්ධන බිල්පත් පියවීම.<br>2025.08.18 – 2025.08.28
<table>
<tr><th>වාහන අංකය</th><th>මුදල රු.</th></tr>
<tr><td>PF 7388</td><td>44,795.00</td></tr>
<tr><td>LD 8614</td><td>17,340.00</td></tr>
<tr><td>JR 7724</td><td>4,911.50</td></tr>
<tr><td>RD 4484</td><td>20,230.00</td></tr>
<tr><td>RE 9232</td><td>20,230.00</td></tr>
<tr><td>PB 0307</td><td>7,225.00</td></tr>
<tr><td>තණකොළ කපන මැෂිම</td><td>7,383.00</td></tr>
<tr><td>එකතුව</td><td>122,114.50</td></tr>
</table></td><td>122,114.50</td></tr>
<tr><td>13</td><td>138</td><td>සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය, බේරුවල</td><td>ඉන්ධන බිල්පත් පියවීම.<br>2025.09.02 – 2025.09.09
<table>
<tr><th>වාහන අංකය</th><th>මුදල රු.</th></tr>
<tr><td>PF 7388</td><td>30,564.00</td></tr>
<tr><td>LD 8614</td><td>16,980.00</td></tr>
<tr><td>JR 7724</td><td>2,413.75</td></tr>
<tr><td>RD 4484</td><td>9,905.00</td></tr>
<tr><td>RD 6208</td><td>14,150.00</td></tr>
<tr><td>RE 9232</td><td>9,905.00</td></tr>
<tr><td>PB 0307</td><td>5,660.00</td></tr>
</table></td><td>93,850.75</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| | | | තණකොළ කපන මැෂිම 4,273.00<br>**එකතුව** **93,850.75** | |
| 14 | 139 | සතර පොත්හල | ඉඳුරුව මහජන පුස්තකාලයේ පුවත්පත් බිල පියවීම. 2025 අගෝස්තු | 16,350.00 |
| 15 | 140 | සතර පොත්හල | ගෝනගල මහජන පුස්තකාලයේ පුවත්පත් බිල පියවීම. 2025 අගෝස්තු | 8,870.00 |
| 16 | 141 | එච්.ඩී. මෙත්තානන්ද | බෙන්තොට මහජන පුස්තකාලයේ පුවත්පත් බිල පියවීම. 2025 අගෝස්තු | 16,230.00 |
| 17 | 142 | ජයසේකරගේ කරුණාදාස | මද්දෙවෙල ආදාහනාගාරය සඳහා 37.5Kg ගෑස් සිලින්ඩර 05ක් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම. | 87,960.00 |
| 18 | 143 | පෝස්ට් මාස්ටර් ජනරාල් 013-1001-99027346 | තැපැල් මුද්‍රා යන්ත්‍රයට මුද්දර පහසුකම් ඇතුළත් කිරීම. | 20,000.00 |
| 19 | 144 | AN Sports | කාර්යාලයේ වොලිබෝල් ක්‍රීඩා කණ්ඩායමේ පුහුණුවීම් කටයුතු සඳහා වොලිබෝලයක් හා දැලක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම. | 13,890.00 |
| 20 | 145 | ලංකා බැංකුවේ පී. ලලිත්කුමාර කරුණාරත්න ගි.අ. 72729581 | ගෝනගලපුර කඩකාමර සඳහා තැන්පත් කරන ලද මුදල් නිදහස් කිරීම. | 20,000.00 |
| 21 | 146 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ජී.එච්. සුනේත්‍රා කුමාරි ගි.අ. 215011400143 | ගෝනගලපුර කඩකාමර සඳහා තැන්පත් කරන ලද මුදල් නිදහස් කිරීම. | 20,000.00 |
| 22 | 147 | බෙන්තොට ප්‍රාදේශීය සභාව | ස්ථිර වැටුප් ගෙවීම. 2025 සැප්තැම්බර් | 1,010,458.00 |
| 23 | 148 | බෙන්තොට ප්‍රාදේශීය සභාව | ස්ථිර වැටුප් ගෙවීම. 2025 සැප්තැම්බර් | 5,420,765.14 |
| 24 | 149 | Marlbo Trading Company | විදුලි අංශයට නිල ඇඳුම් කට්ටල 06 සහ ආරක්ෂිත බූට් සපත්තු කුට්ටම් 03 සඳහා ගෙවීම. | 64,782.00 |

| | | | | |
|---|---|---|---|---|
| 25 | 150 | T & D Fashion | බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් 06 හි දරු දැරියන් සඳහා මසා නිමකරදුන් නිල ඇඳුම් සඳහා ගෙවීම. | 342,400.00 |
| 26 | 151 | කේ. අජිත් ජයරත්න | 2025 සැප්තැම්බර් මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 2,000.00 |
| 27 | 152 | එම්.ඩබ්. අජිත් කුමාර | 2025 සැප්තැම්බර් මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 824.00 |
| 28 | 153 | එච්.වී. සුමිත්‍රා පත්මලතා | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 504.00 |
| 29 | 154 | එච්.වී. සුමිත්‍රා පත්මලතා | 2025 ජූලි මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 432.00 |
| 30 | 155 | එම්.කේ. වසන්තා ප්‍රියදර්ශනි | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 2,240.00 |
| 31 | 156 | එච්.වී. සුමිත්‍රා පත්මලතා | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 1,162.00 |
| 32 | 157 | එච්.ජ්.සී. නිලන්ති | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 2,280.00 |
| 33 | 158 | කේ. අජිත් ජයරත්න | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 3,600.00 |
| 34 | 159 | එම්.කේ. වසන්තා ප්‍රියදර්ශනි | 2025 සැප්තැම්බර් මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 516.00 |
| 35 | 160 | ආර්.ජේ.එස්. මාදුවාගොඩ | 2025 අගෝස්තු මස ගමන් වියදම් දීමනා ගෙවීම. | 474.00 |
| 36 | 161 | මුදල් භාරකරු<br>කාර්යභාර නිලධාරි, ඉඳුරුව | ඉඳුරුව උප කාර්යාලයේ සුළු මුදල් අලුත් කිරීම. | 4,325.00 |
| 37 | 162 | මුදල් භාරකරු<br>එම්.ඩී.එම්. දුලංජල | හබුරුගල නිදහස් ආයුර්වේද වෛද්‍ය නිලධාරි වෙත නිල මුද්‍ර 02 ක් සැකසීම වෙනුවෙන් අත්පිට දරණ ලද වියදම් මුදල් ප්‍රතිපූර්ණය කිරීම. | 3,000.00 |
| 38 | 163 | මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව | සැලසුම් කමිටුවට සහභාගි වීම වෙනුවෙන් දීමනා ගෙවීම. 2025.08.29, 2025.09.04, 2025.09.11 | 52,250.00 |
| 39 | 164 | මුදල් භාරකරු<br>එම්.එම්. ජගත් ප්‍රියන්ත | ගාමිණී විද්‍යාලයට පිවිසෙන මාර්ගය ආසන්නයේ ඇති පිහිඹියා ගසක් කැපීම වෙනුවෙන් ගෙවීම. | 4,500.00 |

| | | | | |
|---|---|---|---|---|
| 40 | 165 | මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව | බලිවල කසල අංගනයේ කසල තේරීමේ කටයුතු සිදුකිරීම වෙනුවෙන් නුපුහුණු සේවකයන් සඳහා දෛනික වැටුප් ගෙවීම. | 39,000.00 |
| 41 | 166 | Induruwa Car Care Service | LD 8614 රථයේ වාර සේවාව සිදුකිරීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 30,620.00 |
| 42 | 167 | පන්නිල හෙට්ටිගේ සුමනසිරි | "ගංවතුර" ළමා කෘතියේ පිටපත් 04 ක් මිලදී ගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 1,120.00 |
| 43 | 168 | EPIC International (PVT) LTD | කම්කරු මහතුන් සඳහා රබර් ග්ලවුස් 50 ක් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 26,196.00 |
| 44 | 169 | Induruwa Tyre House (PVT) LTD | 252-6569 කැබ්රථයේ වීල් එලයිමන්ට් කිරීමට අදාළ බිල්පත් පියවීම. | 6,125.00 |
| 45 | 170 | චමින්ද ඉලෙක්ට්‍රිකල්ස් | TTD 151FD බයිමෙටල් ලයින් ටැප් 500 ක් වෙනුවෙන් ගෙවීම. | 150,000.00 |
| 46 | 171 | රෙජිස්ට්‍රාර් ජනරාල් | බලපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය මගින් මුද්දර ගාස්තු උපලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් කාර්ය මණ්ඩල දීමනා ගෙවීම. | 44,300.00 |
| 47 | 172 | සභාපති, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | RX 0099 ගලිබවුසරයෙන් ලබාගන්නා මල අපද්‍රව්‍ය වාර 14 ක් බැහැරලීම වෙනුවෙන් ගෙවීම. | 42,000.00 |
| 48 | 173 | මහජන බැංකුවේ නලීන් කුසුමින්ද ගි.අ. 084200100032786 | බලිවල කසල අංගනයේ කසල ඉවත් කිරීම සඳහා බැකෝ යන්ත්‍රයක් යොදාගැනීම වෙනුවෙන් ගෙවීම. | 26,400.00 |
| 49 | 174 | Asian Glass | ඉඳුරුව මහජන පුස්තකාලයේ දොරවල්වලට සවිකිරීම සඳහා ක්ලැඩින් බෝර්ඩ්, ලැටිස් පටි, පිත්තල ඇණ මිලදීගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 8,800.00 |
| 50 | 175 | ලංකා බැංකුවේ සම්පත් සිදත් ශ්‍රී කණහැරආරච්චි ගි.අ. 87743598 | 252-6569 කැබ්රථයේ පවර් ස්ටීරියන් බොක්ස් එක හා ඊට අදාළ අලුත්වැඩියාවන් සිදුකිරීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 71,000.00 |
| 51 | 176 | මුදල් භාරකරු<br>ඩී.වී. තරංගි | පළාත් පාලන සතියට සමගාමීව පැවැත්වූ ආයුර්වේද සායනයේ සංවිධාන කටයුතු සඳහා ලබාගත් අත්තිකාරම පියවීම. | (13,000.00) |

01.පිටු අංක 58 සිට 61 දක්වා වූ අංක 01 සිට 51 දක්වා වන වවුචර් පරීක්ෂාකොට අනුමැතිය සඳහා නිර්දේශ කරමු.

02.2025.08.23 දිනැතිව "ට්‍රැක්ටර් ටේලර් 02 ක් මිලදී ගැනීම" යන මැයෙන් යුතුව ගි/05 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කසල එකතු කිරීමේ කටයුතු වෙනුවෙන් දකුණු පළාත් සංවර්ධන සැලැස්ම 2025 පළාත් සංවර්ධන නිශ්චිත ප්‍රදාන, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශය යටතේ වෙන්වී ඇති ප්‍රතිපාදන මත නව ට්‍රැක්ටර් ටේලර් 02 ක් මිලදී ගැනීම වෙනුවෙන් පළාත් යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ඉදිරිපත් කර ඇති අතර එම වාර්තාව ප්‍රකාරව ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව බෙන්තොට ප්‍රාදේශීය සභාව සඳහා නව ට්‍රැක්ටර් ටේලර් මිලදීගැනීමට මිල ගණන් කැඳවීමට අදාළ ටෙන්ඩර් දැන්වීමක් දිනමිණ හා ඩේලි නිවුස් පුවත්පත් දෙකෙහි අවම ඉඩ ප්‍රමාණයකින් එක්වරක් පමණක් පළකිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

03.2025.09.16 දිනැතිව අංක බෙන්/3/16/2 දරණ "ප්‍රාදේශීය සාහිත්‍ය මහෝත්සවය - 2025" යන මැයෙන් යුතුව පරිපාලන නිලධාරි, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, බෙන්තොට විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ජාතික සාහිත්‍ය කලා මහෝත්සවයට සමගාමීව බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ සංස්කෘතික බලමණ්ඩලය එක්ව සංවිධානය කරනු ලබන ප්‍රාදේශීය සාහිත්‍ය උත්සවය 2025.09.30 දින ගා/ඇලකාක මහා විද්‍යාලයේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බැවින් ඒ සඳහා අනුග්‍රහයක් ලබාදෙන මෙන් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව මුදල් ප්‍රතිපාදන නොමැති බැවින් මේ සඳහා අනුග්‍රහයක් ලබාදීමට නොහැකි බවට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

04.2025.09.19 දිනැතිව "252-6569 කැබ්රථය වාර සේවාව සිදුකිරීම" යන මැයෙන් යුතුව සං/02 විෂයභාර නිලධාරි විසින් සභාවට අයත් 252-6569 දරණ කැබ් රථයේ නියමිත වාර සේවාව ආසන්න වී ඇති අතර 5000 KM ධාවනය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව කැබ්රථය සේවාකිරීම සඳහා සභාව ආසන්නයේ පිහිටි Induruwa Car Care Service ආයතනය වෙත යොමුකිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදෙන මෙන් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව 252-6569 කැබ්රථයේ වාර සේවාව Induruwa Car Care Service ආයතනය වෙතින් සිදුකර ගැනීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

05.2025.09.19 දිනැතිව "RD 4484 ට්‍රැක්ටර් රථයේ වාර සේවාව සිදුකිරීම" යන මැයෙන් යුතුව සං/02 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව සභාවේ කසල ඇදීමේ රාජකාරි සඳහා යොදවා ඇති RD 4484 ට්‍රැක්ටර් රථයේ නියමිත වාර සේවාව එළඹ ඇති බැවින් එම සේවා වාරය සභාවේ ලියාපදිංචි බේරුවල, මස්සල පිහිටි A.M. Enterprises (PVT) LTD ආයතනයෙන් සිදුකිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. එ අනුව RD 4484 ට්‍රැක්ටර් රථයේ වාර සේවාව A.M. Enterprises (PVT) LTD ආයතනයෙන් සිදුකිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

06.2025.09.15 දිනැතිව ගි/05 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කෙටුම්පත සකස් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව වාහන නඩත්තුවලට අදාළ (අලුත්වැඩියා, සේවා, අමතර කොටස් ආදී) කටයුතු වෙනුවෙන් පසුගිය වසරේ අවම සැපයුම්කරුවන් ප්‍රමාණයක් ලියාපදිංචි වී ඇති බැවින් පහත අංක

දරණ අයිතමයන් සංශෝධනය කර දිනමිණ පුවත්පතෙහි අවම ඉඩ ප්‍රමාණයකින් එක්වරක් පමණක් පළකිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

- 23,24 අයිතමයන් එක් අයිතමයක් ලෙස
- 25,26 අයිතමයන් එක් අයිතමයක් ලෙස
- 44,45,47 අයිතමයන් එක් අයිතමයක් ලෙස
- 46,48 අයිතමයන් එක් අයිතමයක් ලෙස

07.2025.09.11 දිනැතිව "2026 වර්ෂයේ අයවැය සකස් කිරීම සම්බන්ධව" යන මැයෙන් යුතුව ගි/02 විෂයභාර නිලධාරි විසින් 2026 වර්ෂයේ බෙන්තොට ප්‍රාදේශීය සභාවේ අයවැය වාර්තාවේ මූලික කෙටුම්පත සකස්කර ඇති බැවින් එම වාර්තාව කෙටුම්පත් කිරීමේදී ස්ථිර වැටුපෙන් 20% ක ප්‍රමාණයක් සභා අරමුදලෙන් ප්‍රතිපූර්ණය කර ඇති අතර ඒ අනුව කෙටුම්පත් කරන ලද මූලික කෙටුම්පතෙහි ඇස්තමේන්තුගත ආදායමෙන් පුනරාවර්තන වියදම තුලනය නොවීමේ ගැටලුවක් මතුව ඇති බැවින් 2026 අයවැය කෙටුම්පත් කිරීමට සාකච්ඡා මාර්ගයෙන් සුදුසු තීරණ ගැනීමට කටයුතු කරන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව,

- අයවැය හිඟයට විසඳුමක් වශයෙන් දැනට ප්‍රධාන කාර්යාලයේ යොදවා ඇති පෞද්ගලික ආරක්ෂක සේවය ඉවත්කිරීමටත්
- අපේක්ෂිත මුද්දර ගාස්තු ප්‍රමාණය 2025 වර්ෂයට වඩා වැඩිවන බැවින් එකී ලැබීම් මිලියන 35 ක් ලෙස දැක්වීමටත්
- පළාත් නිශ්චිත ප්‍රතිපාදන මෙම වර්ෂයේ ද මිලියන 10 ඉක්මවා ලැබී ඇති බැවින් එය මිලියන 15 ක් ලෙස ඇතුළත් කිරීමටත්

මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

08.2025.09.23 දිනැතිව "LL7293 ජල බවුසරය අලුත්වැඩියා කිරීම" යන මැයෙන් යුතුව සං/02 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව සභාවට අයත් LL7293 ජල බවුසරයේ සිදුකල යුතු අලුත්වැඩියා කටයුතු සඳහා කොග්ගල ඩිපෝ ඉංජිනේරුවරයාගේ කාර්මික වාර්තාව ප්‍රකාරව අදාළ දෝෂ තත්ත්වයන් අලුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තුවක් ලබාගැනීමට රථය බටපොළ, දික්කැල පිහිටි Foton නියෝජිත කග්ගොඩආරච්චි මෝටර්ස් වෙත යොමු කරන ලද අතර ඒ අනුව අදාළ ආයතනයෙන් රු. 64,200.00 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා ඩිපෝ ඉංජිනේරුවරයාගේ නිර්දේශය ලැබී ඇති බැවින් අදාළ අලුත්වැඩියා කටයුතු සඳහා අනුමැතිය ඉල්ලා ඇත. තව ද මෙම රථයේ නියමිත වාර සේවාව එළඹ තිබූ බැවින් රථය බටපොළ කග්ගොඩආරච්චි මෝටර්ස් ආයතනය වෙත ගෙන ගිය අවස්ථාවක ගරු සභාපතිතුමාගේ උපදෙස් මත වාර සේවාව සිදුකරන ලද අතර එම සේවාව සිදුකිරීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ද ඉල්ලා ඇත.

ඒ අනුව LL7293 ජල බවුසරයේ සිදුකල යුතු අලුත්වැඩියාවන් රු. 64,200.00 ක ඇස්තමේන්තුව අනුව කග්ගොඩආරච්චි මෝටර්ස් ආයතනයෙන් සිදුකරගැනීමටත් ඉහත ජල බවුසරයේ වාර සේවාව මුදල් කමිටු ආවරණ අනුමැතියට යටත්ව සිදුකිරීමටත් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

09.2025.09.19 දිනැතිව "මල්ටි මීඩියා යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සම්බන්ධවයි" යන මැයෙන් යුතුව ගි/05 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව සභාව සතු මල්ටි මීඩියා යන්ත්‍රය නිසි පරිදි ක්‍රියාකාරි තත්ත්වයේ නොපැවතීම හේතුවෙන් එය අලුත්වැඩියා කර දෙන ලෙස ගි/07 විෂයභාර නිලධාරි විසින් ඉල්ලීම් කර තිබූ බැවින් ඒ සඳහා ගරු සභාපතිතුමාගේ උපදෙස් මත ආසන්න ස්ථානයත් වෙත යන්ත්‍රය

යොමුකර දෝෂ තත්ත්වය පරීක්ෂා කරවා ගැනීම සඳහා අම්බලන්ගොඩ, වික්‍රමසූරිය පාර, 23 පිහිටි OMAK Technologies ආයතනය වෙත යොමු කරන ලද අතර එහිදී යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා රු. 44,000.00 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා උපදෙස් ඉල්ලා ඇත. ඒ අනුව මල්ටි මීඩියා යන්ත්‍රයේ Projector Lamp එක පමණක් අලුත්වැඩියාව සඳහා රු. 44,000.00 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත්වී ඇති බැවින් හා මෙම යන්ත්‍රය වසර ගණනාවක් පැරණි යන්ත්‍රයක් බැවින් මෙතරම් මුදලක් වැයකර අලුත්වැඩියාව සිදුකිරීමට හා මිල ගණන් කැඳවා අලුතින් මල්ටි මීඩියා යන්ත්‍රයක් මිලදී ගැනීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

10.2025.09.22 දින "කාර්යාල මේසයක් හා පුටුවක් ලබාගැනීම" මැයෙන් යුතුව බෙන්තොට තාක්ෂණ සේවා නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව ඔහු දැනට භාවිතා කරන මේසය පැරණි වර්ගයේ මේසයක් බැවින් ලාච්චු නිසියාකාරව නොවැසෙන අතර සැලසුම් සම්පූර්ණයෙන් දිගහැර පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් නොවන බැවින් 5'-0''*2'-6' ප්‍රමාණයේ ප්‍රමාණවත් ආරක්ෂිත ලාච්චු සහිත මේසයක් හා දැනට භාවිතා කරන පුටුව අබලන්වී ඇති බැවින් කාර්යාල භාවිතයට සුදුසු පුටුවක් ලබාදෙන මෙන් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව උක්ත සඳහන් ප්‍රමාණයේ කාර්යාල මේසයක් හා පුටුවක් ලබාදීම මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

11.2025.09.15 දින "සංග්‍රහ කටයුතු සඳහා ද්‍රව්‍යයන් ලබාගැනීම" මැයෙන් යුතුව වැඩ ක්ෂේත්‍ර කම්කරු එම්.ඩබ්. අජිත් කුමාර මයා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව ආයතනයේ සංග්‍රහ කටයුතු කිරීමට අවශ්‍ය කරන වීදුරු මග් 12 සහ ලොකු (10L) බොයිලෙරුවක් ලබාදෙන මෙන් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව වීදුරු මග් 12 සහ ලොකු (10L) බොයිලේරුවක් ලබාදීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

12.2025.09.22 දිනැතිව ගි/07 විෂයභාර නිලධාරි විසින් ගබඩාව සඳහා පහත ද්‍රව්‍ය ලබාදෙන ලෙස කර ඇති ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

- LED Bulb 20W (IP65, Orange – Screw Type) – 1000

13.2025.09.18 දිනැතිව "252-6569 රථය අලුත්වැඩියා කිරීම" යන මැයෙන් යුතුව සං/02 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව සභාවට අයත් 252-6569 දරණ වාහනයේ අලුත්වැඩියා කටයුතු රු.19,950.00 ක ඇස්තමේන්තු මුදලකට අලුත්ගම පිහිටි සෙරන්ඩිබ් මෝටර්ස් ආයතනයෙන් සිදුකර ගැනීමට ආවරණ අනුමැතිය ඉල්ලා ඇත. ඒ අනුව උක්ත සඳහන් රථයේ අලුත්වැඩියාව සෙරන්ඩිබ් මෝටර්ස් ආයතනයෙන් රු.19,950.00 ක මුදලකට මුදල් කමිටු ආවරණ අනුමැතියට යටත්ව සිදුකිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

14.2025.09.08 දින "බලිවල කසල අංගනයේ කසල දමන කෙළවර ගින්නක් ඇතිවීම සම්බන්ධවයි" යන මැයෙන් යුතුව බෙන්තොට තාක්ෂණ සේවා නිලධාරිනිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය අනුව 2025.09.08 දින කසල වලේ ඇති වූ ගින්න පාලනය කිරීම සඳහා බැකෝ යන්ත්‍රයක් යොදා කසල ඉවත්කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. ඒ අනුව දිස්ත්‍රික් මිල ගණන් යටතේ ආසන්න ස්ථානයකින් බැකෝ යන්ත්‍රයක් ලබාගැනීම මුදල් කමිටු ආවරණ අනුමැතියට යටත්ව සිදුකිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

| | | |
|---|---|---|
| 01. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා | - | ගරු සභාපති |
| 02. කේ.ඩී.මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

03. රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා - ගරු මන්ත්‍රී
04. නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී
05. ඩී.ඩී.නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී

2025.09.23 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(6)(5). 2025.10.01 දිනැති පුස්තකාල උපදේශන කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාවට ඉදිරිපත් කිරීම.**

2025.10.01 දින පැවති පුස්තකාල උපදේශන කමිටු වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

## පුස්තකාල උපදේශන කමිටු රැස්වීම් වාර්තාව
## 2025.10.01 පෙ.ව.9.00

සහභාගිත්වය

| | |
|---|---|
| අති පූජ්‍ය පරේගම චන්ද්‍රාලෝක නාහිමි | - විහාරාධිපති, ශ්‍රී ධර්මාරාම විහාරය,බෙන්තොට. |
| ප්‍රේමකුමාර විජේවර්ධන මහතා | -ගරු සභාපති,බෙන්තොට ප්‍රාදේශීය සභාව |
| පී.ලෙනිකා දුශාන්ති මිය | - ගරු මන්ත්‍රිනි, බෙන්තොට ප්‍රාදේශීය සභාව |
| ලියනගමගේ අභයරත්න | - ගරු මන්ත්‍රී, බෙන්තොට ප්‍රාදේශීය සභාව |
| යූ.කේ.මධුභාෂිකා දිල්හානි මිය | - ගරු මන්ත්‍රිනි, බෙන්තොට ප්‍රාදේශීය සභාව |
| ජයරත්න ඉඳුරුවගේ මහතා | - ගරු මන්ත්‍රී, බෙන්තොට ප්‍රාදේශීය සභාව |
| පී.එච්.ටී.කේ.හේමචන්ද්‍ර මිය | -ලේකම්, බෙන්තොට ප්‍රාදේශීය සභාව |
| කේ.කේ.ජී.බී.කන්නන්ගර මිය | -කමිටු සාමාජික, ඇලකාක, හබුරුගල |
| ආර්.කේ.ආර්.ලැනරෝල් මහතා | -කමිටු සාමාජික,රන්තොටුවිල,බෙන්තොට |
| ඇම්.පී.මුනිදාස මහතා | -කමිටු සාමාජික,කයිකාවල, ඉඳුරුව |
| වජිර වලල්ලාවිට මහතා | -කමිටු සාමාජික, බෙන්තොට |
| ඩී.වී.තරංගි මිය | -ප්‍රජා සංවර්ධන නිලධාරි,බෙන්තොට ප්‍රාදේශීය සභාව |
| ටී.ඒ.එම්.ගුණරත්න මිය | -පුස්තකාලයාධිපති, හබුරුගල මහජන පුස්තකාලය |
| ඒ.එච්.හර්ෂි කාංචනා මිය | - පුස්තකාලයාධිපති,ඉඳුරුව මහජන පුස්තකාලය |
| ජී.අයි.කුමාරසිංහ මිය | -පුස්තකාල සහයිකා, බෙන්තොට මහජන පුස්තකාලය |
| යූ.කේ.ප්‍රදීපා ලක්මාලි මිය | -පුස්තකාල සහයිකා,ඉඳුරුව මහජන පුස්තකාලය |
| ජේ.ජී.පී.වජිරාණි මිය | -පුස්තකාල සහයිකා,බෙන්තොට මහජන පුස්තකාලය |

❖ පුස්තකාල ප්‍රගති වාර්තාව.

**<u>පුස්තකාල ප්‍රගති වාර්තාව</u>**

**<u>2025 සැප්තැම්බර් මාසය</u>**

| පුස්තකාලයේ නම | පොත් සංඛ්‍යාව | සමාජික සංඛ්‍යාව (2025.07.31 දිනට) | | මුළු සාමාජික සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | ළමා | වැඩිහිටි | ළමා සහ වැඩිහිටි |
| බෙන්තොට මහජන පුස්තකාලය | 14341 | 120 | 3181 | 3301 |
| හබුරුගල මහජන පුස්තකාලය | 9358 | 260 | 1726 | 1986 |
| ඉඳුරුව මහජන පුස්තකාලය | 9089 | 279 | 1153 | 1432 |
| ගෝනගල මහජන පුස්තකාලය | 3379 | 218 | 324 | 542 |

**පොත් නිකුත් කිරිම.**

| පුස්තකාලයේ නම | ළමා | ප්‍රබන්ධ | විවිධ | ඉංග්‍රීසි | එකතුව |
|---|---|---|---|---|---|
| බෙන්තොට මහජන පුස්තකාලය | 147 | 825 | 71 | 16 | 1059 |
| හබුරුගල මහජන පුස්තකාලය | 107 | 753 | 147 | 07 | 1014 |
| ඉඳුරුව මහජන පුස්තකාලය | 228 | 512 | 148 | 07 | 895 |
| ගෝනගල මහජන පුස්තකාලය | 80 | 375 | 17 | 0 | 472 |

**2025 ජූලි මාසය**

**පුස්තකාල කමිටුවේ නිර්දේශයන් ලබාදෙන ලද තීරණ හා යෝජනා.**

❖ ජාතික කියවීමේ මාසය අරමුණු කරගනිමින් පුස්තකාල පාඨකයන් සඳහා තරග පහත දිනයන්හි දි පැවැත්වීමට තීරණය කිරීම.
  - ➢ චිත්‍ර 2025.10.13
  - ➢ රචනා 2025.10.14
  - ➢ පද්‍ය නිර්මාණ 2025.10.15

- විවාද 2025.10.16
- ජන ගායනා 2025.10.17

- ඉහත තරගවල ජයග්‍රාහක,ජයග්‍රාහිකාවන් අගයමින් ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානෝත්සවය 2025.10.31 දින පැවැත්විමට කටයුතු සංවිධානය කිරීම හා උත්සව දින වැඩසටහනට නර්තනාංග හා රසවින්දනාත්මක වැඩසටහනක් ද ඇතුළත් කිරීම.

- ළමා පාඨක තරග ජයග්‍රාහකයන්ට ත්‍යාග සඳහා අභ්‍යාස පොත් ද වැඩිහිටි පාඨකයන් සඳහා සමරුවක් සහ තිළිණපත් ලබා දීම. ත්‍යාගයන් සඳහා අනුග්‍රහක දායකත්වය ලබා ගැනීමට උත්සහ කරන ලෙසට පුස්තකාල කාර්යය මණ්ඩලය දැනුවත් කිරිම.

- අවසන්දින උත්සවයට පෙර එහි සංවිධාන කටයුතු පිළිබඳ තව දුරටත් සාකච්ඡා කිරීම සඳහා 2025.10.27 දින පෙ.ව. 9.00ට පුස්තකාල උපදේශන කමිටුව නැවත රැස් කිරීම.

- 2025 වර්ෂය සඳහා පුස්තකාල ග්‍රන්ථ නොවැම්බර් මස හෝ දෙසැම්බර් මස පොත්හල් වෙත ගොස් මිල දී ගැනීම සුදුසු බවට යෝජනා කිරීම.

ඉහත නිර්දේශයන් ලබා දෙන ලද යෝජනා හා තීරණ ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

2025.10.01 දින පැවති පුස්තකාල උපදේශන කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(6)(6). 2025.10.01 දිනැති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාවට ඉදිරිපත් කිරීම.**

2025.10.01 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2025/10/01 දින ප.ව. 1.00ට බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද ප්‍රසම්පාදන කමිටු රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.

සහභාගීත්වය

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. ලෙනිකා දුශාන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රී
3. උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී
4. පුණ්‍ය ශ්‍රී ලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
5. තාරක විජේකෝන් මැතිතුමා - ගරු මන්ත්‍රී
6. K.D.මිගාර නේමින්ද මැතිතුමා - ගරු මන්ත්‍රී

**01.බෙන්තොට ප්‍රාදේශීය සභාවට අයත් මහ ඉදුරුව, වරකමුල්ල, මල්මාඩුවාකන්ද පෙර පාසල සඳහා ළමා මේස සහ පුටු මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම**

මිල ගණන් කැඳවූ කාලසීමාව - 2025/09/14 - 2025/09/29

ලිපිගොනු අංකය - බෙප්‍රාස/ගි/05

| අනු අංකය | අවශ්‍ය අයිතමය සහ නියමිත පිරිවිතර | අවශ්‍ය ප්‍රමාණය | දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර ඇති මිල | | | |
|---|---|---|---|---|---|---|
| | | | නිෂ්පාදිත ලී වර්ගය | ඒකකයක මිල | ලබාදෙන වගකීම් කාලය | ප්‍රවාහන පහසුකම් පිළිබඳව |
| 01 | <u>ළමා මේසය</u><br>උස අඩි 02<br>පළල අඩි 1 ½<br>දිග අඩි 04<br>වර්ණය - නිල් | | කකුල් ඇට්ටෝනියා ලෑලි ගිණිසපු දැව | 5200/- | වසර 03 | ප්‍රවාහනය සඳහා රු. 290/- මුදලක් අය කරනු ලබයි. |
| | | | සියළුම කොටස් මහහෝගනි දැව | 6500/- | වසර 03 | |
| 02 | <u>ළමා පුටුව</u><br>උස - බිම සිට අඩි 01<br>පුටු ඇන්ද අඩි 01<br>ආසනයේ ප්‍රමාණය වර්ග අඩි 01<br><br>වර්ණය - නිල් | | කකුල් ඇට්ටෝනියා ලෑලි ගිණිසපු දැව | 3500/- | වසර 03 | |
| | | | සියළුම කොටස් මහහෝගනි දැව | 4000/- | වසර 03 | |

අදාල භාණ්ඩ හා උපකරණ සපයා ගැනීම සඳහා සභාවේ ලියාපදිංචි වි ඇති ආයතන වෙතින් සහ දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව වෙතින් ලියාපදිංචි තැපෑලෙන් මිල ගණන් කැඳවූ නමුත් ඒ සඳහා කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි. කෙසේ නමුත් මෙම පෙර පාසල සඳහා ළමා මේස සහ පුටු කඩිනමින් ලබාදිය යුතු බැවින් (අදාළ පෙර පාසලේ දරුවන් ප්ලාස්ටික් මේස,පුටු භාවිතා කරන බැවින්) අදාල ද්‍රව්‍ය සැපයීම සඳහා එක් ආයතනයක් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුනද එම ආයතනය පූර්ණ රජයේ ආයතනයක් බැවින් සහ විධිමත් ආකාරයට පැහැදිලිව නියමිත පිරිවිතරයන්ට අනුව මිල ගණන් සමඟ වසර 03ක වගකීම් කාලයක් ලබාදී ඇති බැවින්, එම ආයතනයේ පහත මිල ගණන් යටතේ අදාල ද්‍රව්‍ය මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

- ❖ කකුල් ඇට්ටෝනියා දැවයෙන් සහ ලෑලි ගිනිසපු දැවයෙන් නිමවා තීන්ත ආලේප කර එක් ළමා මේසයක් රු.5200/=ක් බැගින් මේස 04ක් රු.20,800/=ක මුදලකටත්, එක් ළමා

පුටුවක් රු.3500/= බැගින් පුටු 30ක් රු.105,000/=ක මුදලකට මිලදී ගැනීමටත්, ප්‍රවාහන ගාස්තු ලෙස 1km සඳහා රු.290/= බැගින් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලබන බිල්පත ගෙවීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**02.සැලසුම් අනුමැතියට අදාල අයදුම්පත් මුද්‍රණය කිරීම සඳහා මිල ගණන් කැඳවීම**

මිල ගණන් කැඳවූ කාලසීමාව - 2025/09/11 – 2025/09/30

ලිපිගොනු අංකය - බෙප්‍රාස/ගි/05

| | අවශ්‍ය අයිතමය | අවශ්‍ය ප්‍රමාණය | මිල ගණන් ඉදිරිපත් කිරීමේ ආයතනය | |
|---|---|---|---|---|
| | | | නිම්රා මීඩියා හවුස් අළුත්ගම | ශ්‍රී විජය ප්‍රින්ටර්ස් අළුත්ගම |
| 01 | වීපී රේඛා (නොපරවාගැනීම් සහතික අයදුම්පත්) | 500 | රු. 5.00 | රු.7/ 60 |
| 02 | ජල සම්බන්ධතා ලබාගැනීමේදී මාර්ග පළුඳු අවසර පත්‍ර | 5000 | රු. 5.00 | රු.7/ 60 |
| 03 | ඉඩම් අනුබෙදුම් අයදුම්පත් | 500 | රු. 5.00 | රු. 19/75 |
| 04 | ගොඩනැගිලි අයදුම්පත් | 500 | රු. 110.00 | රු. 121/90 |

සභාවේ ලියාපදිංචි සහ ප්‍රදේශයේ ආසන්න ආයතන වෙතින් මිල ගණන් කැඳවූ අතර ආයතන 02ක් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි. එම මිල ගණන් සලකා බැලූ කමිටුව අදාල ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ අළුත්ගම, ගාලු පාර පිහිටි නිම්රා මීඩියා හවුස් වෙතින් වීපී රේඛා අයදුම්පතක් රු.5 බැගින්, අයදුම්පත් 500ක් රු. 2500/=ක මුදලකටත්, ජල සම්බන්ධතා ලබා ගැනීමේදී මාර්ග පළුඳු කිරීමට අවසර පත්‍රයක් රු.5/= බැගින් අයදුම්පත් 500ක් රු.2500/=ක මුදලකටත්, ඉඩම් අනුබෙදුම් අයදුම්පතක් රු.5/= බැගින් අයදුම්පත් 500ක් රු. 2500කටත්,ගොඩනැගිලි අයදුම්පතක් රු.110/= බැගින් අයදුම්පත් 500ක් රු.5500/= මුදලකටත් මුද්‍රණය කිරීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**03. <u>බෙන්තොට හොරවල තොටුපළ හන්දියේ සිට ඉත්තැපාන තොටුපළ දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියට අදාළව ජාතික සීමිත ලංසු කැඳවීම</u>**

මිල ගණන් කැඳ වූ කාලය - 2025.09.10 – 2025.10.01

ලිපිගොනුවේ අංකය - බෙප්‍රාස/සං/03/02/07/ප.නි./මාර්ග/2025

| ආයතනයේ නම සහ ලිපිනය | ලංසු මිල (රු.) | | ලංසු සුරක්ෂණය තිබෙන බැංකුවේ නම හා ලිපිනය | ලංසු සුරක්ෂණයේ වටිනාකම (රු.) | ලංසු ඇපකරයේ වලංගු කාලය |
|---|---|---|---|---|---|
| | වැට් රහිත | වැට් සහිත | | | |
| පී.එන්. කන්ස්ට්‍රක්ෂන් | 5,304,354.00 | වැට් ලියාපදිංචි නොමැත | අප ආයතනයට මුදල් තැන්පත් කොට ඇත<br>2025.10.01 දිනැති ලදුපත් අංක 036028 | 70,000.00 | - |

(ලංසු සුරක්ෂණය - රු.70,000.00 - 2026.01.21 දක්වා)

ජාතික සීමිත ලංසු කැඳවීම යටතේ බෙන්තොට ප්‍රාදේශීය සභාව වෙත 2025 වර්ෂය සඳහා මාර්ග ප්‍රතිසංස්කරණයට කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කරගෙන නොමැති බැවින් ඉදිකිරීම් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි ගාල්ල දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත්කරුවන් අතරින් ව්‍යාපෘතියේ වටිනාකමට අදාළ ශ්‍රේණිය සපුරා ඇති (C8 or above) බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට යාබද කරන්දෙණිය, ඇල්පිටිය හා බලපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් 2025.09.02 දිනැති බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රසම්පාදන කමිටුව මඟින් තෝරා ගන්නා ලද කොන්ත්‍රාත්කරුවන් 14 දෙනා වෙත ලංසුපත් යොමු කළ අතර එක් ආයතනයක් පමණක් ලංසු කැඳවීමේ කාලය ඇතුළත මුද්‍රා තබන ලද ලංසුපත් ඉදිරිපත් කර තිබුණි.

එක් ආයතනයක් ලංසු කැඳවීමේ කාලය පසු වී ලංසුපත් ඉදිරිපත් කළ නමුත් එම ලංසුපත භාර ගැනීම ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රතික්ෂේප කරන ලදී.
2025.10.01 දින ප.ව.1.00ට එම ලංසුපත් විවෘත කළ අතර එම ලංසුපත් ඇගයීම සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත යොමු කර තීරණයක් ලබා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

**04.** __කොම්පෝස්ට් අංගනය සෑදීම (ගොඩනැගිල්ල/ ආරක්ෂිත වැට/ ගේබියන් බැම්ම) ව්‍යාපෘතියට අදාළව ජාතික සීමිත ලංසු කැඳවීම__

මිල ගණන් කැඳ වූ කාලය - 2025.09.17 – 2025.10.01
ලිපිගොනුවේ අංකය - බෙප්‍රාස/සං/03/02/10/ප.නි./ස.අ.ක/2025

| ආයතනයේ නම සහ ලිපිනය | ලංසු මිල (රු.) | | ලංසු සුරක්ෂණය තිබෙන බැංකුවේ නම හා ලිපිනය | ලංසු සුරක්ෂණයේ වටිනාකම (රු.) | ලංසු ඇපකරයේ වලංගු කාලය |
|---|---|---|---|---|---|
| | වැට් රහිත | වැට් සහිත | | | |
| එච්.එස්.කේ. බිල්ඩර්ස් | 6,324,770.00 | වැට් ලියාපදිංචි නොමැත | අප ආයතනයට මුදල් තැන්පත් කොට ඇත<br>2025.10.01 දිනැති ලදුපත් අංක 036032 | 60,000.00 | - |

(ලංසු සුරක්‍ෂණය - රු.60,000.00 - 2026.01.28 දක්වා)

ජාතික සීමිත ලංසු කැඳවීම යටතේ බෙන්තොට ප්‍රාදේශීය සභාව වෙත 2025 වර්ෂය සඳහා Irrigation & Drainage අංශය යටතේ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කරගෙන නොමැති බැවින් ඉදිකිරීම් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි ගාල්ල දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත්කරුවන් අතරින් ව්‍යාපෘතියේ වටිනාකමට අදාළ ශ්‍රේණිය සපුරා ඇති (C8 or above) බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට යාබද කරන්දෙණිය, ඇල්පිටිය හා බලපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් මුල්ම කොන්ත්‍රාත්කරුවන් 15 දෙනා වෙත ලංසුපත් යොමු කළ අතර එක් ආයතනයක් පමණක් ලංසු කැඳවීමේ කාලය ඇතුළත මුද්‍රා තබන ලද ලංසුපත් ඉදිරිපත් කර තිබුණි.

2025.10.01 දින ප.ව.2.00ට එම ලංසුපත් විවෘත කළ අතර එම ලංසුපත් ඇගයීම සඳහා තාක්‍ෂණ ඇගයීම් කමිටුව වෙත යොමු කර තීරණයක් ලබා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. ලෙනිකා දුශාන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රී
3. උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී
4. පුණ්‍ය ශ්‍රී ලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
5. තාරක විජේකෝන් මැතිතුමා - ගරු මන්ත්‍රී
6. K.D.මිගාර නේමින්ද මැතිතුමා - ගරු මන්ත්‍රී

2025.10.01 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**(7). <u>ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබද වාර්තා සහ වෙනත් ලේඛන සභාවට ඉදිරිපත් කිරීම හා සලකා බැලීම</u> :-**

**(7)(1). 2025 සැප්තැම්බර් මස ලැබීම් හා වියදම් වාර්තාව ගරු සභාවට ඉදිරිපත් කිරීම.**

2025 සැප්තැම්බර් මස ලැබීම් හා වියදම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

| 2025 සැප්තැම්බර් මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය | |
|---|---|
| පුනරාවර්තන ආදායම් එකතුව | රු. 11,537,039.18 |
| එකතු කලා මූලධන ලැබීම් :- | - |
| පුනරාවර්තන හා මූලධන ලැබීම්වල එකතුව | **රු. 11,537,039.18** |
| බලපත්‍ර බදු | රු. 5,925.00 |
| සේවක ණය | රු. 913,736.80 |
| තැන්පත් | රු. 1,517,315.96 |

| | |
|---|---|
| දේපළ ණය පොළී | රු. 14,694.56 |
| සාමාන්‍ය අත්තිකාරම් | රු. 71,362.00 |
| වැටුප් හා වවුචර් මුද්දර බදු | රු. 3,175.00 |
| UDA සේවා ගාස්තු තැන්පත් | රු. 250,412.00 |
| 101 ට බැර | රු. 19,849.80 |
| 201 ට බැර | රු. 25,000.00 |
| 301 ට බැර | රු. 22,513.42 |
| ස්ථාවර තැන්පත් | 7,500,000.00 |
| එකතුව | **රු. 21,881,023.72** |
| 2025 සැප්තැම්බර් මස ඒකාබද්ධ වැය සාරාංශය | |
| පුනරාවර්තන වියදම් එකතුව | රු. 12,000,964.59 |
| එකතු කලා -ප්‍රාග්ධන වියදම් | රු. 343,211.25 |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන වැයවල එකතුව | **රු. 12,344,175.84** |
| දේපළ ණය පොලී | රු. 14,694.56 |
| තැන්පත් | රු. 2,621,545.78 |
| සාමාන්‍ය අත්තිකාරම් | රු. 268,933.00 |
| සේවක ණය | රු. 560,610.00 |
| ගබඩා අත්තිකාරම් | රු. 150,000.00 |
| ණය හිමියෝ | රු. 3,789,898.17 |
| එකතුව | **රු. 19,749,857.35** |

2025 සැප්තැම්බර් මස ලැබීම් හා ගෙවීම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව, ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**(7)(2). 2025. 09.30 දිනට බැංකු සැසඳුම් වාර්තාව ඉදිරිපත් කිරීම**

2025.09.30 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගිණුම් අංක 2758780 දරණ පොදු ජංගම ගිණුම, අංක 81618288 දරණ සේවක ණය ජංගම ගිණුම හා අංක 2759057 දරණ කර්මාන්ත ජංගම ගිණුම යන බැංකු ගිණුම්වලට අදාළ බැංකු සැසඳුම් වාර්තා ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙම බැංකු සැසඳුම් වාර්තා පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් කරන ලද යෝජනාව, ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**(7)(3). 2025.09.30 දිනට හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම**

2025.09.30 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හිඟ ආදායම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

| ආදායම් ශීර්ෂය | බෙන්තොට/ ඉඳුරුව/ හබුරුගල |
|---|---|
| 1. වරිපනම් බදු | රු. 14,594,650.61 |
| 2. අක්කර බදු | රු. 190,449.00 |
| 3. 1% බදු | රු. 1,000.00 |
| 4. කර්මාන්ත/ ව්‍යාපාර බදු | රු. 700.00 |
| 5. වෙළඳ ස්ථාන කුළී | රු. 63,770.00 |
| **එකතුව** | **රු. 14,850,569.61** |

2025 සැප්තැම්බර් මස බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හිඟ ආදායම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**(8).** **<u>වෙනත් කරුණු</u>**

**(8)(1).** **<u>ටෙන්ඩර් හා මිල ගණන්</u> :-** කිසිවක් නැත

**(8)(2).** **<u>ඇස්තමේන්තු හා ගිවිසුම් සහාගත කිරීම</u> :-**

<u>ඇස්තමේන්තු අංක 01:-</u>

ව්‍යාපෘතියේ නම :- බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහල හා ඉතිරි අලුත්වැඩියාවන් සිදු කිරීම - අදියර I

මුදල :- රු. 2,000,000.00

<u>ඇස්තමේන්තු අංක 02 :-</u>

ව්‍යාපෘතියේ නම :- බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහල හා ඉතිරි අලුත්වැඩියාවන් සිදු කිරීම - අදියර II

මුදල :- රු. 2,000,000.00

ඉහත ඇස්තමේන්තු පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**(8)(3).** **<u>ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් ප්‍රකාශ කිරීම</u> :-**

<u>ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය</u>

පසුගිය ප්‍රසම්පාදන කමිටු රැස්වීමේ දී බල්බ මිල දී ගැනීම සම්බන්ධයෙන් ගැටලුවක් මතු වුණා. ආයතනවල බල්බ නොමැති වීම හේතුවෙන්. ඒ අවස්ථාවේ දී ගරු සභාපතිතුමාගේ හැකියාවෙන් වැඩි මිලට ඇණවුම් කිරීමට සිදු වන්නට තිබූ බල්බ 500 ක් එම මිලට වඩා අඩුවෙන් රුපියල් 350,000/- ක පමණ මුදලක් සභාවට ඉතිරි කරමින් ඇණවුම් කර මිල දී ගැනීමට හැකියාව ලැබුණා. ඒ සම්බන්ධව මම මේ අවස්ථාවේ ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමාට ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම ඔබඩවත්ත මාර්ගය පසුගිය දිනක කවදාවත් නැතිව ජලයෙන් යටවුණා. එම දිනය නිහාල් මැදගොඩ මැතිතුමාටත්, මධුභාෂිකා දිල්හානි මැතිතුමියටත් වෙන් කර දී තිබුණු දිනයක් කඨින පිංකම් සඳහා බල්බ සවි කිරීම් ආදී කටයුතු වෙනුවෙන්. ඒ අවස්ථාව හදිසි අවස්ථාවක් සේ සලකා එම මන්ත්‍රීවරුන්ගේ කටයුතු අවලංගු කර එම මාර්ගයේ ජලය බැසයාමේ කටයුතු සිදු කිරීම වෙනුවෙන් කම්කරුවන් ලබා දීම සම්බන්ධයෙන් එම මන්ත්‍රීවරු දෙදෙනාට මාගේ ස්තූතිය පල කරනවා. ඒ වාගේම වැඩ පරිපාලක රවී මහතාටත්, කම්කරු මහත්වරුන් සියලු දෙනාටත් ගරු සභාපතිතුමාටත් මම ස්තූතිවන්ත වෙනවා ඒ අවස්ථාවේ දී සිදු කළ කාර්යභාරය වෙනුවෙන්. ඒ වගේම සියලුම මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස දැනුවත් කිරීමක් සිදු කරන්න තියෙනවා. මහජන සෞඛ්‍ය පරීක්ෂක තිස්ස මහතා දැනුම් දීලා තිබුණා ඔක්තෝම්බර් 16 දින සිට ඔක්තෝම්බර් 29 දින දක්වා වන කාලය තුළ සෑම සතියේ දිනකම අයාලේ යන සුනඛයින් වන්නත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන බව. මේ අතරතුරේ ඒ මහතා නැවත දැනුවත් කිරීමක් කරලා තියෙනවා පවතින වර්ෂාපතනය නිසා මේ වැඩ සටහන සතියකින් කල් ගියා කියලා. එන්නත් කිරීමේ මධ්‍යස්ථාන නෑ. අයාලේ යන සුනඛයින් සිටිනවා නම් ඒ මහතාගේ දුරකතන අංකය වන 075 0460931 අංකයට දැනුවත් කිරීමක් සිදු කරන්න. එවිට ඔවුන් ඒ සඳහා පැමිණේවි. අවුරුදු 02 කට පසුව තමයි ජල භීතිකා එන්නත ලබා දෙන්න පටන් අරන් තියෙන්නේ. මම ඉල්ලා සිටිනවා සියලුම මන්ත්‍රීවරුන්ගෙන් තිස්ස මහතාට ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියලා.

<u>ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>

මුලින්ම ස්තූතිවන්ත වෙනවා ගරු සභාපතිතුමාට බල්බ මිල දී ගැනීමේ දී විශාල මුදලක් සභාවට ඉතිරි කර දීම වෙනුවෙන්. ඒ වගේම දින ගණනාවක් මම දැක්කා හබුරුගල උප කාර්යාලයේ රාත්‍රී කාලයේ දී විදුලි පහන් වැඩි ගණනක් දැල්වී තිබුණා. ඉතිං මේ නිසා විදුලි බිල වැඩි වෙනවා. ඒ පිළිබඳ සොයා බලන්න කියා දැනුවත් කරනවා. ඒ වගේම මේ ගොඩනැගිල්ලේ වහලය තෙමෙනවා. මේ ගැනත් අවධානය යොමු කරන්න. එම කොන්ත්‍රාත්කරුවන් මඟින් එහි අලුත්වැඩියා කටයුතු සිදු කර ගැනීමට කටයුතු කරන්න. ඒ වගේම ආරච්චිමුල්ල කෝම්මල පාරට පිවිසෙන් ස්ථානයේ බෝක්කුවට යොදා ඇති කොන්ක්‍රීට් ලෑලි කැඩිලා ගිහින් තියෙනවා. ඒ සම්බන්ධව කඩිනම් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා දැනුවත් කරනවා. මේ දිනවල අලුත්වැඩියා කටයුතු සිදු කරන කුරුම්ටිගොඩ පාලම අසලින් ඉවත් කරන පස් දැමීමට යොදාගෙන තිබෙන්නේ ඒ පාරේ තියෙන ඉඩමක්. ඒ නිසා ඉක්මනින් එහි කටයුතු සිදු කරන්න.

<u>ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා</u>

බල ප්‍රදේශයේ සිදු කරන සියලුම ඉඩම් කට්ටි කිරීම් සිදු කරන භූමිවලට අදාළ පාරවල්, කාණු පද්ධති, ජල පහසුකම් සැලසීම ආදී සියලු දේ සැලකිල්ලට අරගෙන අනුමැති ලබාගෙන කටයුතු කරන්න කියලා ඉල්ලනවා. මීට පෙර සභාවල් වලදී අනුමැති ලැබුණු පාරවල් තියෙනවා මේ වෙනකන් තාර දාලා නෑ. ඉඩම් කැබලි කිරීමේ ව්‍යාපෘතිවල පාරවල්වල තාර දාන්න අපිට බෑ. මේ ඉඩම් කැබලි කරපු තැන්වල පාරවල් හදල නෑ. ජල පහසුකම් නෑ. කාණු පද්ධති නිසි ලෙස සකස් කරලා නෑ. ඉතිං මේ සභා කාලය තුළ අපි ඉඩම් කට්ටි කිරීමේ ව්‍යාපෘති නිසියාකාර නියාමනයක් කරලා හරියට ඒ දේවල් සිදු වුණාට පස්සේ සභාවෙන් දිය යුතු අනුමැතිය ලබා දෙන්න කියලා ඉල්ලනවා. ඒ වගේම පසුගිය දිනක සහභාගී වූ අල්ලස් හා දූෂණය පිළිබඳ පැවති වැඩමුළුවේ දී දැනුවත් කරා එක් එක් අංශවල කටයුතු වල යෙදෙන සේවකයන් මාස 06 න් 06 ට මාරු කරන්න කියලා. අපේ සභාව පිළිබඳ පසුගිය කාලයේ ජනතාව අතර ලොකු ප්‍රසාදයක් ඇති වෙලා තිබුණා. නමුත් සමහර සේවකයන්ගේ ක්‍රියාවන් නිසා මේ වන විට එම ප්‍රසාදය නැතිවෙමින් පවතිනවා. ඉතිං මම යෝජනා කරනවා පළමුවෙන්ම අපේ රියදුරු මහතුන්ගේ රාජකාරී ලැයිස්තුවක් සකස් කරන්න කියලා. මාස 06 න් 06 ට රාජකාරිය වෙනස් වන ලෙස. ඒ වගේම විදුලි පහන් සවි කිරීම සඳහාත් අපි හොඳ වැඩ පිළිවෙලක් සකස් කරන්න ඕන. සභාපතිතුමාගේ අධීක්ෂණය යටතේ කමිටුවක් පත් කරලා ඒ කමිටුව හරහා හෝ ඉදිරියට විධිමත් ලෙස කටයුතු කරමු.

<u>ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>

සභාවේ කරනු ලබන ටෙන්ඩර් සිදු කිරීම්, සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම් ආදිය පිළිබඳ මන්ත්‍රීවරු සියලු දෙනා දැනුවත් කරන්න කියලා මතක් කරනවා. ඒ වගේම පසුගිය දිනක කිසියම් කොට්ඨාසයක උත්සවයකට සභාපතිතුමා උප සභාපතිතුමා සහභාගී වෙන්න හදනකොට තව මන්ත්‍රීවරයෙක් කියනවා ඒක නවත්තන්න කියලා. මේ විදියට මන්ත්‍රීවරු 23 දෙනා එකට එකමුතුව වැඩ කරන්නේ කොහොම ද?

<u>ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා</u>

සැපයුම්කරුවන් ලියාපදිංචි කරන ආකාරය මිල ගණන් කැඳවීම් සිදු කරන ආකාරය පිළිබඳ පැහැදිලි කිරීමක් අවශ්‍යයි.

<u>ගරු මන්ත්‍රී සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා</u>

මිල ගණන් ලියා පදිංචි ආයතන වෙත යොමු කළත් ඒ අතුරින් ආයතන 02 ක් වගේ තමයි බොහෝ වෙලාවට මිල ගණන් ඉදිරිපත් කරන්නේ. ලැබෙන මිල ගණන් සලකා බලද්දි ආසන්න ස්ථානයකින් ලැබෙන්නේ මිල ගණන් එකක් වගේ. බහුතරයක් තිබෙන්නේ කොළඹ, නැතිනම් දුර බැහැර ප්‍රදේශ වලින්. නමුත් සාධාරණ අවම මිල ගණන් ඉදිරිපත් කර තිබෙනවා නම් ආසන්න ස්ථානයට ඇණවුම ලැබෙනවා.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් බවට සභාව පත් කිරීම සුදුසු බවට කළ යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ප.ව. 12.20 ට කාරක සභා අවස්ථාව ආරම්භ විය.

මෙහි දී ලේකම් පී. එච්. ටී. කේ. හේමචන්ද්‍ර මිය විසින් ආයතනය සැපයුම්කරුවන් ලියාපදිංචි කරන ආකාරය කාල සීමාව, මිල ගණන් කැඳවන ආකාරය හා කාල සීමාවන් ආදිය පිළිබඳ විධිමත් පැහැදිලි කිරීමක් සිදු කරන ලදී.

- ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කාරක සභාව මහ සභාව බවට පත් කිරීමට කළ යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ප.ව. 12.55 ට කාරක සභාවේ කටයුතු අවසන් වී මහ සභාවේ කටයුතු ආරම්භ විය.

<u>ගරු මන්ත්‍රිනී ලෙනිකා දූශාන්ති මැතිතුමිය</u>
සභාවේ බැකෝ යන්ත්‍රයේ මේ වන විට තත්ත්වය කුමක් ද? ලයිට් වාහනයත් කැඩිලා. අනික් නිල් පැහැ කැබ් රථයත් ළඟ දී හැදුවේ. නමුත් මේ වන විට එහිත් දෝෂ තිබෙනවා.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
බැකෝ යන්ත්‍රය අලුත්වැඩියාව සඳහා ගිවිසුම්ගත වෙලා තියෙනවා. සසිදු මෝටර්ස් ආයතනය. එයා පොරොන්දු වෙලා තියෙනවා මාසයක් ඇතුළත මේක හදලා දෙන්න. මේ ගිවිසුම කඩ කළොත් ඒ ආයතනය සතියට රු. 2,000/- බැගින් සභාවට ගෙවිය යුතුයි. එයාට බැරිවෙලා තියෙනවා මේ වෙනකන් බැකෝ යන්ත්‍රය හදලා භාර දෙන්න. ඇහුවම මොකක් හරි කොටසක අඩුපාඩුවක් කියනවා. මේ ගිවිසුමේ පිටපත් පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කරලා තියෙන්නේ. ඒ නිසා මේකට චෝදනා කරලා වැඩක් නෑ. මේ කෙනා අසාදුලේඛන ගත වෙලා ඉන්නේ. ඒ නිසා එයාට යන්ත්‍රයට අවශ්‍ය කොටස් සැපයුම් ආයතනලින් ලබා ගැනීමේ නොහැකියාවක් පවතිනවා. මේ සඳහා විසඳුමක් සොයමු.

- මේ අවස්ථාවේ දී සභාවේ ඝෝෂාකාරී තත්ත්වයක් ඇති විය.

<u>ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූශාන්ති මැතිතුමිය</u>
බැකෝ යන්ත්‍රය සම්බන්ධව දිගින් දිගටම අර්බුධකාරී තත්ත්වයක් ඇති වෙනවා. සභාවේ තියෙන නීති ක්‍රමවේදයත් එක්ක ඔහුට සාකච්ඡා කරලා ඒ අවශ්‍ය මුදල ලබා දීමට හැකයාව පවතිනවා නම් එසේ කරමු.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
අපිට පුළුවන් මේ වෙනකන් ඔහු කරලා තියෙන වැඩ කොටස වෙනුවෙන් ගෙවීමක් සිදු කරන්න. ඒ මගින් ඔහුට ඉතිරි කොටස් ලබා ගැනීමේ හැකියාව පවතිනවා.

<u>ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>
මංගල සභා වාරයේ ඉඳන්ම බැකෝ යන්ත්‍රය පිළිබඳ සාකච්ඡා වෙනවා. බැකෝ යන්ත්‍රයේ අඩුපාඩුව නිසා සභාවේ වැඩ විශාල කොටසක් අතපසු වෙලා තියෙනවා. එම ගවී ගිය කාලය ආපසු අරගන්න බෑ. එම බැකෝ යන්ත්‍රයේ ඒජන්ට්වරයා සම්බන්ධ ගැටලුවක් පවතින බව කියනවා. නමුත් මේ අවට තිබෙන අනෙක් සභාවලත් භාවිත කරන්නේ මේ වර්ගයේ බැකෝ යන්ත්‍ර. එම ආයතන මේ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ සොයා බලා ඉංජිනෙරුතුමාගේ සහයෝගයත් ලබා ගෙන ලබන සභා වාරයට පෙර ඉක්මන් විසඳුමකට යන්න කියලා  මම කියනවා.  නැතිනම් ඔබතුමාගේ ධූර කාලය අවසන් වන තෙක්ම මේ බැකෝ යන්ත්‍රය අලුත්වැඩියා නොවේවි.

## (8)(4). <u>ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම</u> :-

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් අද දින සභාවට නොපැමිණි පහත මන්ත්‍රීවරුන් ඉදිරිපත් කර ඇති නිවාඩු ඉල්ලීම් ලිපි ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

01. ගරු මන්ත්‍රී මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමාගේ නිවාඩු ඉල්ලීම් ලිපිය
02. ගරු මන්ත්‍රී එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමාගේ නිවාඩු ඉල්ලීම් ලිපිය
03. ගරු මන්ත්‍රී සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමාගේ නිවාඩු ඉල්ලීම් ලිපිය
04. ගරු මන්ත්‍රී ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමාගේ නිවාඩු ඉල්ලීම් ලිපිය

ඉහත මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
මෙතෙක් වෙලා සභාවේ රැඳී සිටිමින් සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය දැක්වූ උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ 17 දෙනාටම ස්තූතිවන්ත වෙමින් සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා. සියලු දෙනාටම ස්තූතියි.

ප.ව. 13.15 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

..................................................
ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා,
සභාපති,
බෙන්තොට ප්‍රාදේශීය සභාව

<u>**බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2025 ඔක්තෝම්බර් මස මාසික මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන**</u>

<u>**සංශෝධන අංක 01 - ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන සංශෝධන**</u>
2025.10.21 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 18 හි (5)(11)(7) යෝජනාවට අදාළව ගිණුම් අංක " පොදු ගිණුම 2759057 හා කර්මාන්ත ගිණුම 2758780" යන්න වෙනුවට " පොදු ගිණුම 2758780 හා කර්මාන්ත ගිණුම2759057" යන්න ඇතුළත් කර සංශෝධනය විය යුතු බව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

..................................................
ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා,
සභාපති,
බෙන්තොට ප්‍රාදේශීය සභාව